# මිනිසාගේ සම්භවය

[ සිංහල – Sinhala – سنهالي ]

ආචාර්ය අයිෂා ලෙමු

පරිවර්තක

එස්.එම්.එම්.මන්සූර්

2013 - 1434

IslamHouse.com

# خلق الإنسان

« باللغة السنهالية »

الأستاذة/عائشة ليمو

ترجمة: إس إم محمد منصور

2013 - 1434

IslamHouse.com

# මිනිසාගේ සම්භවය

කතෘ

## ආයිෂා ලෙමූ

## පටුන

1. පූර්විකාව

2. බටහිර කෙරෙහි ඇති ආශාව

3. මෙම විශ්වයේ සම්භවය

4. ජීවය හා ජීවින්ගේ සම්භවය

5. පරිණාම වෘද්ධිය

6. මිනිසාගේ සම්භවය

7. සාරාංශය

## පූර්විකාව

එදා දවස අද වගේ මට මතකයි.

1979 වසරේ දෙසැම්බර් මස දිනක නයිජීරියාවේ මින්නා නගරයෙහි විශේෂ සම්මන්ත්‍රණයක් පැවැත්විය. 'නූතන ලොවට ඉස්ලාමය ගැලපෙන්නේද?' යනු එහි මාතෘකාවයි. 'මිනිසාගේ සම්භවය සිදුවුයේ කෙසේද?' යන මැයෙන් මම එහි දේශනයක පැවැත්වුයෙමි.

ඔබ අතට පොතක් වශයෙන් පත්වී තිබෙන්නේ එම දේශනයයි.

'මිනිසා වානරයන්ගෙන් පැවත එන්නෙකි' නම් වූ පරිණාමවාදය මගේ දේශනය තුළින් සාකච්ඡාවට ලක් කළෙමි. අවස්ථා තුනකදී මට මුහුණු පාන්නට සිදුවූ කරුණු තුනක් මීට හේතු විය.

පළමු කරුණු මෙයයි.

මම සොකෝටා බාලිකා විද්‍යාලයෙහි විදුහල්පතිනිය ලෙස කටයුතු කරන කල, දිනක් මා වෙත පැමිණි ශිෂ්‍යාවක්, "මැඩම්, අපේ පංතියේ ගුරුතුමිය 'මිනිසා වානරයා ගෙන් පැවත එන්නෙකු' බව අපට උගන්වයි. එය ඇත්තද?" යනුවෙන් ප්‍රශ්න කළාය. ඉන් නොනැවතුනු ඇය, තම අත තිබුණු පොතක්ද මගේ මේස මත විවෘත කොට තැබුවාය. එම පිටුවල මිනිසා වානරයාගෙන් පැවත එන බව කියා පාන පින්තූරු වගයක් තිබිණ.

මම මදක් කලබලට පත්වුනෙමි. එහෙත් එය නොපෙන්වා 'කුමක් කරම්ද?' යනු සිතුවෙමි. ඇය තවමත් මා ඉදිරියේය. 'මොන වගේ පිළිතුරක් දෙන්නද?' මට නොවැටහුණි.

මම එංගලන්තයේ උපන්නෙක්මි. අධ්‍යාපනය ලැබුවේද එහිමය. එහි ආගමික ඇදහීම් නමට පමණක් සීමා වී තිබෙන අතර, විද්‍යාවට දී ඇත්තේ දේවත්වයකි. එහි ජනතාව විද්‍යාවට වැඳ වැටී ගෙන ජීවත්වීම නොරහසකි.

මා ඉගෙන ගත් විශ්ව විද්‍යාලය අති විශිෂ්ඨ වුවක්. එහෙත් එම ශිෂ්‍යාවට පිළිතුරක් දිමට බැරි අසරණ තත්ත්වයක මම සිටියෙමි.

එබැවින්, කුමන පිළිතුරක් දී එම ශිෂ්‍යාව පිටත් කළෙමි දැයි මට මතක නැත. එම ප්‍රශ්නය නම් මට අමතක වුයේම නැත. විටින් විට එම ප්‍රශ්නය මගේ සිතට නැගෙන්නේය. ඒ සෑම මොහොතකම මගේ සිතෙහි හටගත් ප්‍රශ්න සැවොම සම්පිණ්ඩය කොට මෙසේ දැක්විය හැකිය.

- මිනිසාගේ පළමු උපත සිදුවුයේ කෙසේද?

- චාර්ල්ස් ඩාර්වින්ගේ මතය කුමක්ද?

- අනෙකුත් විද්‍යාඥයන් මේ සම්බන්ධව දරන මතය කුමක්ද?

- ශුද්ධ වූ අල් කුර්ආනය මේ සම්බන්ධව පවසන්නේ මොනවද?

මෙම ප්‍රශ්න මුල් කරගෙන කරුණු සෙවීමෙහි මම උත්සුකව ක්‍රියා කළ බව කියනු කැමැත්තෙමි.

ඇත්තෙන්ම ඒ ශිෂ්‍යාව එදා නැගු ප්‍රශ්නය ඇයට පමණක් සීමා කළ නොහැකිය. එය මුලු ශිෂ්‍ය පරපුරේම ප්‍රශ්නයක් වනවාට කිසිදු සැකයක් නැත. එබැවින් එය නොසලකා හරිනු බැරිය.

අනෙක් අය කොහොම වෙතත්, උගත් මුස්ලිම්වරුන් මෙම ප්‍රශ්නයට අදාළ නියම පිළිතුරු සොයා ගත යුතුයි. එය අනිවාර්යයි. එපමණක් නොව, හේතු සාධකව එය ඔප්පු කිරීමේ හැකියාවක්ද, තමන් තුළ ඇතිකර ගැනීම අවශ්‍යයි.

විද්‍යාව ගැන මම අධිකව යමක් නොදනිමි. එහෙයින්, මම දන්නා හඳුනන මුස්ලිම් විද්‍යාඥයන් හා වෙනත් උගතුන්ගෙන් මේ ගැන උනන්දු වන ලෙස ඉල්ලා සිටියෙමි. මෙම කරුණ සිතට ගෙන පර්යේෂණාත්මකව යමක් කරන ලෙස අයැද සිටියෙමි. ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා අනෙකුත් අය වැටෙන්නට යන වැරදි මතයෙන් ඔවුන්ව බේරාගැනීමට කටයුතු කිරීම මහත් වගකීමක් බවත් කියා සිටියෙමි.

එහෙත් එයට නිසි ප්‍රතිචාරයක් නොලැබින. මගේ මෙම ප්‍රයත්නයට කිසිවෙකුගේ සහය ලැබෙන බවට සලකුණක්වත් පෙනෙන්නට නොතිබින. ඇතැම් විට ඔවුන්ට මෙය මහත් ප්‍රශ්නයක් නොවුනා විය හැකිය. ඔවුන්ගේ ඊමානය (දේව විශ්වාසය) අචල වුවක් විය හැකිය. මේ වගේ මොනම ප්‍රශ්නයකින් හෝ එම විශ්වාසය නොසැලෙනු හැකිය.

එහෙත් අනාගත ශිෂ්‍ය පරපුර හා අනෙක් අය......?

මගේ සිත කැළඹීමට පත්කළ දෙවන කරුණ මෙයයි.

වරක්, මම ගුරු අභ්‍යාස විදුහලකට ගියෙමි. ඒ 1976 වසරේය. එම විදුහලේ ගුරුවරියක් හමු වූ කල, ඇය පරිණාමවාදය ඉගෙන්වීමට ආධාර කර ගන්නා පොත් වගයක් අත තබා ගෙන සිටියාය. ඒවා එකිනෙක ගෙන බැලූ කල කොතරම් පිළිවෙලකට පරිණාමවාදයට අදාළ කරුණු සකස් කොට

තිබුනේ දැයි දැකගත හැකිවිය. එ සමගම මගේ සිතේ යටපත් වි තිබුණු ඒ පැනය නැවතත් සිහියට නැගී, නොයෙකුත් සිතිවිලි ඇති කළේය.

"මෙම පොත් සතියකට දෙකකට දෙන්න පුළුවන්ද? කියවල දෙන්නම්?' මම ඇසුවෙමි. ඇය 'බැහැ' කීවේ නැහැ.

මම ගෙදර පැමිණියේ 'එම පොත් කියවන්න ඕන.' යන ආශාවෙන් ඉවසිල්ලක් නැතිවය. එදා සවස අඳුර වැටීගෙන එන විට ගෙදරට ගොඩවූ මා ඇගපත සෝදා ගෙන,කඩිනමින් තේ එකකුත් පිළියෙල කරගෙන, එම පොත් කියවන්නට වීමි.

මිනිසා වානරයාගෙන් පැවත එන කථාවෙහි ඇත්තක් නැත. එහි මට සැකයක්ද නැත. එය ඇත්තක් බව පිළිගැන්වීමට මෙම පොත්වලින් කෙතරම් විශාල උත්සාහයක් ගෙන තිබේද යනු දුටු මා විමතියට පත්වීමි. ඊට අදාළ පින්තූරු රැසක්ද එහි තිබිණ.

"ලොව මැවු දෙවි කෙනෙක් නැත." යනු වාද කරන්නකුට නම් මෙම පොත් වරප්‍රසාදයක් වනවා නොඅනුමානයි.

ශිෂ්‍යයන්ට නියම බුද්ධියක් හා ජීවිතය ගැන මනා අවබෝධයක් ලබාදීම ගුරු මහත්මා මහත්මීන්ගේ ඉමහත් වගකීමකි. මෙම උතුම් කර්තව්‍යය දේව විශ්වාසයත් සංකලනය කොට ඉටුකරන කල, යහපත් ගුණ ධර්මයන් ගෙන් හෙබි පරපුරක් බිහිවනවාට සැකයක් නැත. (මේ සඳහාම ආගම, සාදාචාරය, ගති පැවතුම් පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයකුත් ඊට අදාළ පෙළ පොතුත් තිබිය යුතුයි. විද්‍යාව, ආර්ථිකය හා අනෙකුත් පාඩම්ද සැකසී තිබිය යුතුයි. ඊට සරිලන අන්දමින් ඒවාට ගුරු හවතුන්ගේ සේවය අර්ථවත් වන්නේය. අද ඇත්තේ ආර්ථික

දියුණුවට ප්‍රමුඛ ස්ථානයක් දෙන අධ්‍යාපන ක්‍රමයකි. සුලු වශයෙන් ඉඩකඩ දී ඇති ආගම උගන්වන්නේද ඊට සරිලන ආකාරයෙනි. මෙහි ප්‍රතිඵලය පැහැදිලිය. අද ශිෂ්‍යයන් මුරණ්ඩු වීමටත් ප්‍රචණ්ඩ ක්‍රියාවෙහි යෙදීමටත් මෙය ප්‍රධාන හේතුවකි.)

එහෙත්, මෙවැනි පොත්පත් පදනම් කොට අපගේ ගුරු මහත්මා මහත්මියන් උගන්වන්නේ නම්, ශිෂ්‍ය පරපුරට අනාගතය කුමක් වේවිද?

මට ඇතිවුයේ දරාගත නොහැකි වේදනාවකි.

එම ගුරු අභ්‍යාස විදුහලෙහි පුහුණුව ලබන ගුරුවරුන් ගෙන් බොහෝ දෙනෙක් මුස්ලිම්වරුන් වෙති. ඔවුහු මෙම පරිණාමවාද මතය පිළිගන්නෙහිද?නැතහොත් ප්‍රතික්ෂේප කරන්නෙහිද? මෙය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට ගෙන දක්වන කරුණු මොනවාද? මෙය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට දහස් ගණන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගුරුවරන් වශයෙන් ඔවුහු කොහොමද විස්තර කරන්න යන්නේ?

මෙවැනි ප්‍රශ්න රාශියක් අඛණ්ඩව මගේ සිතෙහි මතුවිය. මේවාට පිළිතුරු අවශ්‍යයි මට හැගුණි. කවුරු කොහොම වුනත් මම මගේ වගකීම ඉටුකළ යුතුයි. එබැවින්, නොපසුබටව, යුහුසුළුව, මේ ගැන කරුණු සෙවීමට උනන්දු වුයෙමි.

මගේ උත්සාහය දිනෙන් දින අධිකවිය. පොත් ගණනාවක්ම කියවුයෙමි. එතුලින් එක්රැස් කරගත් කරුණු චාර්ල්ස් ඩාර්වින්ගේ පරිණාමවාද මතයට අභියෝග කරන තරම් තර්කානුකූල විය. ඊට උදව් වූ අල්ලාහ් ට මම ප්‍රශංසා කළෙමි. අනෙකුත් අයටද සිත් පතුලින් කෘතඥ වීමි.

එහෙත්, මෙම කරුණු සියල්ල පිළිවෙළකට සකස් කොට පොතක් ලිවීමට මට අවස්ථාවක් නොලැබිණ. මෙසේ සිටියදී මම ක්‍රියාශීලි වීමට උනන්දු කරවන තෙවැනි කරුණ මෙසේ සැකසුණි.

මගේ පියාට විටින් විට ලිපි ලියන මම, මෙම ප්‍රශ්නවලට යොමුවී සිටියදී ලිවු ලිපියක මේ ගැන විස්තරාත්මකව ඔහුට ලීවෙමි. ඊට පිළිතුරු දුන් ලිපියක ඔහු සඳහන් කළේ, "ඩාර්වින් ගේ මතය ඉස්ලාමයට ඉතා සමිපව එකගව තිබේ" යනුවෙනි. එමගින්, හෙතෙම ඩාර්වින්ගේ මතයට කිසිදු විරුද්ධත්වයක් නැති බව හැගවුයේය.

ඉන් පසුවත් මම මගේ වැඩකටයුතුවල ප්‍රමාදවීම සුදුසු නොවන බව මට වැටහුණි. මම සොයා තබා තිබුණු කරුණු සියල්ල පිළිවෙලක් කෙළෙමි. ඊට අවශ්‍ය සාධකද සොයා අවශ්‍ය තැන්හී යොදා එය සම්පූර්ණ කෙළෙමි.

ඒ උත්සාහය, අද ඔබ අතට කුඩා පොත් පිංචයක් ලෙසට පත්වී ඇත. අල් හම්දු ලිල්ලාහ්.

මෙය ඔබ වැනි පාඨකයින්ගේ අත්වලට පත් කිරීමට පෙරාතුව ඇතැම් මුස්ලිම් ශිෂ්‍යයන්ට දී අදහස් දක්වන ලෙස මම ඔවුන්ගෙන් ඉල්ලා සිටියෙමි. ඔවුහු මෙය කියවා බලා අගය කිරීමෙන් නොනැවතී පොතක් වශයෙන් මුද්‍රණය කිරීම කාලෝචිත බවත් පැවසුහ. එයින් මා ලත් ධෛර්යයත් මෙය මුද්‍රණය කිරීමට හේතු විය.

මිනිසාගේ සම්භවය සිදුවූයේ කොසේද? ඩාර්වින්ගේ පරිණාම වාදය සත්‍යක්ද? වැනි ප්‍රශ්නවලට මෙම පොත් පිංචය නියම පිළිතුරක් වන බව විශ්වාසයකි.

විද්‍යා අංශයට නැඹුරු වූ මුස්ලිම්වරුන් මෙම පොත් පිංචය පදනම් කරගෙන තව තවත් පර්යේෂණ පැවැත්විය යුතු බව ඉතාමත් බැගෑපත්ව ඉල්ලා සිටිමි.

වර්තමානයේ පවතින නොයෙකුත් ප්‍රශ්න සම්බන්ධව ඉස්ලාමය ගෙන දෙන විසඳුම් රැගත් ග්‍රන්ථ බහුලව නිකුත් වෙමින් තිබීම ඉමහත් සුතුටට කරුණකි. ඉස්ලාමය නියමාකාරයෙන් වටහා ගත හැකි එවන් අගනා ග්‍රන්ථ එදත්, අදත් එළි දැක්වීම උතුම් වූ කර්තව්‍යයකි.

ලොව පවතින අනෙකුත් සංස්කෘතීන්ගේ බිඳවැටීම ගැන ජනමාධ්‍ය ලොවට හගවා සිටියි. එම හේතුවෙන් මිනිසුන් නොමග යෑම පැහැදිලිවම පෙනෙන්නට ඇත. මෙම භයානක අවස්ථාවෙහි මුස්ලිම්වරුන් තම වගකීම ඉටු කිරීමට පෙරට ආ යුතුයි. ඉස්ලාමය මිනිස් වර්ගයාගේ ප්‍රශ්න විසඳා යහපත් ජීවිතයක් ගෙනදෙන උතුම් ධර්මයක් ලෙසත් අගනා ප්‍රතිපත්තියක් ලෙසත් ලොවට හඳුනා දිය යුතුයි. විශේෂයෙන් බටහිර රටවලද කොමියුනිස්ට් රටවලද මිනිසා විඳින දුකෙන් මිදීමට ඇති එකම මාර්ගය ඉස්ලාමය බවට පැහැදිලි කොට ජනතාව දැනුවත් කළ යුතුයි.

මෙම රටවල අදේවවාදය පැතිරෙමින් පවතී. ඇතැම් රටවල දේව විශ්වාසය නමට පමණක් සීමාවී ඇත. ‘‘දෙවියකු සිටියොත් අපට මොකද? එය අපට ප්‍රශ්නයක් නොවේ.‘‘ යනු

පැකිලීමකින් තොරව පවසන්නෝ ඇතැම් රටවල බහුලව සිටිති. 'ආගම අබින්' යනු ලොවට පැවසුවේ කොමියුනිස්ට් වරුන්ය.

'මිනිසාට කෙතරම් සම්පත් තිබුනද ඒවා භුක්ති විඳීමට ඉඩ නොදෙන මායාවකි ආගම.' යනු අදේවවාදීන් වාද විවාද කරති. එහෙත් මේ කිසිවෙකු මිනිසාගේ ප්‍රශ්න විසඳා ඔහුට යහපත් ජීවිතයක් ගෙන දුන් බවට කිව නොහැකිය.

අද දියුණුවූ රටවල් ලෙස ප්‍රකට වූ රටවල තත්ත්වය කුමක්ද? යනු සෑම දෙනා දනිති. එහි දිනෙන් දින වැඩිවෙමින් පවතින වැරදි හා පාප ක්‍රියා වලටත්, සියදිවි නසා ගැනිම්වලටත් මුල් වී ඇත්තේ ඔවුන් පිළිපදින ප්‍රතිපත්ති හා ඊට අදාළ ජීවිත ක්‍රමවේ. විශේෂයෙන් දේව ඇදහිල්ල නොමැති වීම ප්‍රධාන හේතුවක් වෙයි.

මෙම තත්ත්වය දැන් දැන් කවුරු කවුරුත් වටහා ගැනීමේ හේතුවෙන් අදේව වාදය කෙමෙන් මිනිස් සමාජයෙන් සමුගැනීමට පටන් ගෙන ඇත. මිනිසුන්ගෙන් බහුතරයක් තම ජීවිතය අර්ථවත් විය යුතුයි යන්නෙන් සිතා කටයුතු කරන්න උත්සුක වෙති. උනන්දු වෙති. ඉතා උතුම් වූ සදාචාර්මක ගතිපැවැතුම් වලින් සපිරුණු ජීවිතයක් ගැන සිහින මවති.

මෙවන් අවදියක එහි ජනයාට ඉස්ලාමය පිළිගැන්වීම මුස්ලිම්වරුන් වන අපගේ අති විශාල වගකීමකි. යුතුකමකි.

මිනිසා මවන කල ඔහුගේ සිත් සතන්හි අල්ලාහ් තැන්පත් කළ 'දේව ඇදහීම' නම් වූ බීජය ලොව පුරාම කෝටි සංඛ්‍යාත පැළෑටි බිහි කරමින් ඇත. එම පැළෑටි දළුලන කල, වනසා

දැමීමට කිසිවකුට ශක්තියක් නැති බව එහි වර්ධනයත් ඊට විරුද්ධ වුවන්ගේ පහත බැස්මත් පෙන්වා දෙයි.

මිනිස් සිත් සතන්හී ධාරණය වී ඇති දේව විශ්වාසය මුලිනුපුටා දැමූ බව අදේවවාදීන් උදම් ඇනිය හැකිය. එහෙත් ලෝක ඉතිහාසය පෙන්වන්නේ ඔවුන් එම ප්‍රයත්නයෙහි පරාජයට පත් වූ බවයි. දේව විශ්වාසය තවතවත් මිනිස් සිත්වල තැන්පත් වන බවයි.

දේව බිය භක්තිය කෙරෙහි නැඹුරු වන්නන්ට තවත් වැදගත් ශුභාරංචි යක් ඇත. එය මෙයවේ.

ඔවුන්ගේ සියළු ප්‍රශ්න විසඳා දුක් ගැහැට සදහටම තුරන්කොට දෙලොව සතුටට හා සැනසිල්ලට මග පෙන්වන මාර්ගයක් ඇත. එනම් ඉස්ලාමයයි. මුළු විශ්වයම මැවූ එකම දෙවියෙකු වූ සර්ව බලධාරි අල්ලාහ් පිරිනැමූ ඉස්ලාමයයි.

ඉස්ලාමය කිසිවකුගේ සහජ බුද්ධියට පටහැණි වුවක් නොවේ. එය බුද්ධිමත් අයගේ බුද්ධිමය අවශ්‍යතා ස්වභාවයට එකග සපුරා දෙන දේව ධර්මයකි.

එබැවින් අදේව වාදින්ගේ ප්‍රතිපත්ති ගවේෂණය කොට ඒවායෙහි තිබෙන වැරදි හේතු සහගතව ඔප්පු කළ යුතුයි. ඒවා කෙසේ මිනිසා නොමග යවන්නේද යනු පෙන්වා දිය යුතුයි. ඒ අතර ඉස්ලාමය කෙතරම් සාධාරණව බුද්ධියට එකගව මග පෙන්වා මිනිසාට දෙලොව සහනය ගෙන දෙන්නේද යන්නත් හේතු සාධකව පැහැදිලි කළ යුතුයි.

මෙය මුස්ලිම් සියළු දෙනාම තම වචනයෙන්, ක්‍රියාවෙන් හා පොත පතෙන් ඉටු කළ යුතු මහගු වගකීමකි.

අල්ලාහ් අප සැමට යහමග පෙන්වත්වා.

බී.අයිෂා ලෙමු

ඉස්ලාමිය අභ්‍යාස කවය

මින්නා. නයිජීරියාව

1980 පෙරවාරි මස 11 වෙනි දින

මහා දයාන්විත මහා කරුණාන්විත අල්ලාහ් ගේ නාමයෙනි

## 1. බටහිරය කෙරෙහි ඇති ආශාව

බටහිර රටවල තිබෙන අධ්‍යාපනය, මුස්ලිම් රටවල් තුළට ගෙන ඒමෙන් වන්නේ මහත් විපතකි. එම අධ්‍යාපනය මොන ආකාරකින් වුවද එහි ප්‍රතිඵලය එයයි. මෙය සියළු මුස්ලිම්වරුන් විසින් පිළිගෙන ඇති සත්‍යයකි.

ඊට හේතුව, එම අධ්‍යාපනය මුස්ලිම් රටවල් තුළට ගෙන එනවිට ඔවුන්ගේ දැනුම හා භාෂාව පමණක් නොව එ සමගම ඔවුන්ගේ සංස්කෘතිය හා සිතුම් පැතුම්ද අප තුළට පිවිසීමයි.

එනයින්, බටහිර සංස්කෘතිය කෙතරම් වේගයෙන් මුස්ලිම්වරුන් අතර පැතිර යන්නේද යනු ඔවුන්ගේ වෙනස් වෙමින් පවතින ඇඳුම් පැළඳුම් හා අනෙක් හැසිරීම්වලින් වටහා ගත හැකිය. බටහිරයේ විපරීත ශිෂ්ඨාචාරය අකුරට පිළිපදින කිසිවෙකුට ඒ ගැන බියක් ලැජ්ජාවක් නැති බව පෙනේ.

බටහිර පන්නයට හැඩගැසුණු උගතුන්, (?) අඳුම් පැළඳුම් නමින් කරන කෝලම් අපි නොදන්නවා නොවේ. ඇඳීමට පහසු, බැලීමට ගෞරවය ගෙන දෙන ඇඳුම්, අපට ඉස්ලාම් හඳුන්වා දී ඇත. එහෙත් ඒ ඇඳුම් ඉවත ලා ඇවිදින විට කකුල් හිරවෙන, වාඩිවෙන විට ඉනට වේදනා දෙන, අඩ නිරුවත් ඇඳුම්වලට ඇලුම් කරන්නෝ එමටය.

බැලීමට කැත, ඇවිදීමට අපහසු, අඩ නිරුවත් ඇඳුම්වලටයි බටහිර ශිෂ්ටාචාරය යනු කියනු ලබන්නේ.

මෙම ශිෂ්ටාචාරය ලබාදුන් තවත් දායාදයකි, නවීන පාවහන්.

පාදවලට ආරක්ෂාව හා අලංකාරය ගෙන දෙන පාවහන් අද අයින්කොට ඇත. ඒ වෙනුවට පැළඳ ගෙන ඇවිදින්න බැරි, ඇතැම්විට ඇවිදින්න හැකිවුවත් බොහෝ සේ අවහිර ඇතිකරන පාවහන් පැළඳ ගැනීමට ඇතැමුන්ට ඇත්තේ පුදුම ආශාවකි.

ඉනිමගක නැග සිටිනා මෙන් පෙනෙන උස්වූ පාවහන් පළඳින අය අද අප අතර බහුලව සිටිති. ඒවා පිළිගත් කාන්තාවෝ පාරතොටේ විඳින දුක දකින කල ඇතිවන්නේ ඉමහත් සංවේගයකි. තවත් අතකින් එය බැලීමට ඇතැමුන් විනෝදයක්ද වන්නේය.

"විද්‍යාව ගැන විස්තර කියන්න යන පොතක ඊට කිසිසේත් අදාළ නොවන දේ ගැන විමර්ශණාත්මකව කියන්නේ ඇයි දැයි ඇතැමුන් ප්‍රශ්න කළ හැකිය."

මම විමර්ශණය කළ බටහිර ඇඳුම් පැළඳුම් හා අසංවර පිළිවෙත අද ලොවෙහි 'විප්ලවීය ක්‍රියා මාර්ගයක්' යනු පිළිගැනීමක් ඇත. එබැවින් මගේ විමර්ශණය, පාඨය ඔබට විමතියක් විය හැකිය. මෙම පොතේ මාතෘකාවට පටහැනි බවත් වැටහෙන්නට ඇතිය.

මෙම පොතෙහි මෙම කරුණු ගෙන දැක්වීමට ප්‍රධාන හේතුව බටහිර සංස්කෘතිය කෙරෙහි තිබෙන මගේ හැඟීමයි. අද නොමග යවන බටහිරය ගැන කෙටියෙන් හෝ හැඳින්වීමක් කිරීමටයි මම මෙම කරුණු මෙහි ගෙන දැක්වුයෙමි.

ඇතැමුන් අනෙක් අය අනුකරණය කිරීමෙහි කෙතරම් අනුවණ විදිහට හෝ හැසිරෙන්නට මැලිවන්නේ නැත.

සිව් දෙනෙක් කුමක් හෝ මුල්කර ගෙන පිස්සු නටන්නේ නම් එය ඇතැමුන්ට කලාවක් වෙයි. එය ඒ ආකාරයෙන්ම තමනුත් කිරීමට ලැජ්ජා වන්නේද නැත. කවරකු එයට සහභාගි නොවන්නේද හෙතෙම 'යමක් කමක් නොදන්නා ගොඩයින්' යනුවෙන් හඳුන්වනු ලබයි. මෙම කරුණු පෙන්වා දීමටයි මම මේවා සඳුහන් කළේ.

අපි අලුත් සංස්කෘතික් වෙත ඇදී යන විට අපෙන් ප්‍රතික්ෂේපවූ සංස්කෘතියට වඩා එය උසස්ද, උතුම්ද යනු සිතා බලන්නේ නැත. ඇත්තෙන්ම අනෙක් අය අනුකරණය කිරීම ඇඳුම් පැළඳුවලට පමණක් සීමා වී නැත. එය අපගේ ජීවිතයේ බොහෝ අංගවල විසිරී පැතිරී ඇත.

අපගේ බුද්ධිය, සිතුවිලි, ජීවිතයේ ප්‍රශ්නවලට විසඳුම ලබා ගැනීම වැනි බොහෝ අංගයන්හී අන්ධයන් මෙන් බටහිර මාවතේ ගමන් ගන්නෝ බොහෝ වෙති. තම ආගම, ධර්මය සම්බන්ධවද ඔවුහු හැසිරෙන්නේ ඒ ආකාරයෙනි.

බටහිර ඇඳුම්, පැළඳුම්, පාවහන් වැනි දේ සිත්ගන්නා සුළු බවත්, කලාත්තමක බවත් සිතනවා මෙන් ඔවුන්ගේ බුද්ධිය, විශ්වාසය, හා චින්තනය ගැනත් උසස්ව සිතන්නෝ සිටිති.

මිනිසුන් අතර බටහිර පන්නයේ සැකසුණු පාවහන්වලට ඇත්තේ පුදුම ඇශාවකි. එයින් කොපමණ අවහිර ඇතිවුවද, ඒවා අත්හැරීමට නම් කැමැත්තක් දක්වන්නේ නැත. මෙම ආකර්ෂණය මෙතැනින් නොනවතී. ජීවිතයේ සෑම අංගයකම, අඩියක් අඩියක් පාසාම, ඔවුන් අනුකරණය කොට ජීවත්වීමට පෙළඹෙන බටහිර ජීවිත ක්‍රමයේ කොතෙකුත් අඩුපාඩු තිබුනත්,

එයින් ජීවිතයේ නියම අරමුණ ඉටුනොවන බව දැන සිටියත්, ඒ ගැන නොසලකා ඒ මාවතේම පිය නගති.

අද මෙම බටහිර චින්තනය විද්‍යාවේ මුවාවෙන් මුස්ලිම්වරුන්ගේ සිත් තුළට පිවිස ඇත. මුස්ලිම්වැන් මෙයට දුන් අනුමැතිය මෙය ශක්තිමත් වීමට ප්‍රබල හේතුවක් වි ඇත.

බටහිර චින්තන හා ජීවිත ක්‍රමය බොහෝ විට ඉස්ලාම් ධර්මයට පට හැනිය. එහෙත් මුස්ලිම්වරුන් බහුතරයක් මෙය වටහා ගන්නේ නැත. මෙය කණගාටු විය යුතු කරුණකි. මුස්ලිම්වැන් ගෙන් සුළුතරයක් තම ඊමාන් සහ තමා නොමග යවන බටහිර චින්තනය අතර පවතින වෙනස වටහා ගෙන සිටින්නෝ වෙති.

බටහිර රටවල පුදපූජා ලබන විද්‍යාව 'මෙයයි සත්‍යය' යනුවෙන් යමක් පෙන්වයි. එහෙත් මුස්ලිම්වරුන් පිළිගෙන ඇති ධර්මය, තවෙකක් සත්‍ය බව පෙන්වා, එය පිළිගන්නා ලෙස පවසයි. බොහෝවිට විද්‍යාව තුළින් හෙළිදරව් වන මත, ආමික අදහස් සමග එකගවන්නේ නැත.

මෙවැනි තීරණාත්ම අවස්ථාවලදි නියත වශයෙන්ම සත්‍යය කුමක්ද යන්න සෙවීමට වෙහෙසෙන මුස්ලිම්වරුන්ගෙන් ඇතැමුන් ඉස්ලාමයෙන් ඈත් වී යන අවාසනාවන්ත තත්ත්වයකට ගොදුරු වෙති. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ එවැන්නන් ඉස්ලාමය අතහැර යෑමයි. මෙය බුද්ධිමය අංශයෙන් මුස්ලිම්වරුන් මුහුණ පාන ගැටළුවකි.

ඉස්ලාමය,දර්ශනය පිළිබඳ අදහස්වලින් හෙබි කූඩාරමක් නොවේ. මුස්ලිම්වරයෙක් යනු, ඉස්ලාමයේ අණපනත්වලට ඇස් පියාගෙන 'හිස වැනුවොත් ඇති' යන තත්ත්වයක

සිටින්නකුද නොවේ. ඇත්ත වශයෙන්ම ඉස්ලාමය ගැනත් එහි ඇති අණපනත් ගැනත් මනා දැනීමකුත්, දැඩි විශ්වාසයකුත් මුස්ලිම්වරයෙකුට තිබිය යුතුයි. මේ සම්බන්ධව කිසිම මුස්ලිම්වරයෙකුට, මොනම අවස්ථවකදී වුවද අල්ප මාත්‍රයක අවිශ්වාසයක් නොතිබිය යුතුය.

මිනිසා මැවීමේ අරමුණ ඉතා පැහැදිලිව පවසන්නේ ඉස්ලාමය පමණයි. එයයි සත්‍යය. ඉස්ලාමය පමණයි යහ මග වන්නේ. මිනිස් මැවීමේ අරමුණ නිසියාකාරව ඉටුවන අන්දමින් ඉස්ලාමයේ නීතිරීති, අණපනත් හා අනෙකුත් උපදෙස් සියල්ලක්ම සකසා දී ඇත. මෙය වෙනත් ආකාරයකින් පවසන්නේ නම්, ඉස්ලාමය සකස් කොට දි ඇති ජීවිත ක්‍රමය අනුව ජීවත්වන්නේ කවරෙකුද, හෙතෙම මිනිසත් බව ලබා ගැනීමේ නියම අරමුණ, ප්‍රතිඵලය ඉටුකර ගත් කෙනෙකු වීමයි.

ඉස්ලාමය ඉදිරිපත් කොට ඇති සත්‍ය කරුණු ප්‍රතික්ෂේප කිරීමට හෝ අසත්‍ය බව තර්ක කිරීමට යමකු තැත්කළ හැකිය. එවිට නිහඬව සිටින මුස්ලිම් වරයකුගේ ඊමානය (දේව විශ්වාසය) දුර්වල වෙයි. ඉස්ලාමයේ අත්තිවාරම දෙදරා යන තරමට කරුණු කාරණා යෙදෙන්නා නම්, අනිකුත් සාමාන්‍ය දේ ඇහිරී යෑම ඉබේටම සිදුවිය හැකිය. ඉස්ලාම යෙන් බැහැර වී යන බව මම ඉහත සඳහන් කළේ මෙයයි.

බටහිර රටවල පවතින අධ්‍යාපන ක්‍රමය යටතේ ඉගැනුම් ලබන මුස්ලිම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉතාමත් ප්‍රවේශම් විය යුතුයි. තමන්ට එහි ලැබෙන අදහස් එකහෙලාම පිළිනොගෙන විමසා බැලිය යුතුයි. එය ඔවුන්ගේ යුතුකමක් මෙන්ව වගකීමක්ද වේ.

නැතිනම් ඔවුහු නොමග යන තත්ත්වයට ගොදුරු වන්නට සිදු වෙයි.

මම මෙහි තවත් කරුණක් පැහැදිලි කරනු කැමැත්තෙමි. එනම් ඉස්ලාමය සහ විද්‍යාව එකිනෙකට පටහැනි බව වාදකිරීමට මම මෙහි නොපැමිණියෙමි. එසේ වාද කිරීමෙහි කිසිදු සත්‍යතාවයක් නැත. හේතුව මුස්ලිම්වරුන් විද්‍යාව නිසිපරිදි ඉගෙන ගත යුතුයි යන්න බල කරන එකම ආගම ඉස්ලාමය වීමයි.

මුස්ලිම්වරුන් අධිකව නොයෙකුත් පර්යේෂණ පැවැත්විය යුතු බවත් තමා අවට පවතින ලොව හා එහි අඩංගු දේ ගැන විමසා බැලිය යුතු බවත් ශුද්ධ වූ අල් කුර්ආනය පවසයි.

අල් කුර්ආනයෙහි අඩංගු දේව වාක්‍යවල නොයෙකුත් විද්‍යාත්මක සත්‍යයන් තිබෙනවා දැකගත හැකිය. එමෙන්ම විද්‍යාව තුළින් අප ලද නොයෙකුත් දේ අල් කුර්ආනයට විවරණ වශයෙන් පවතින බවත් දක්නට ඇත.

එහෙත් බටහිර, විද්‍යාව ගෙන දක්වන යම් යම් න්‍යායයන් ඉස්ලාමයට එකග නොවන තත්තත්වයක තිබෙන බව පෙනෙන්නට ඇත. මෙවැනි තත්ත්වයකදී ඊමානය (දේව විශ්වාසය) ඇති මුස්ලිම්වරුන් පහත සඳහන් තීරණ දෙකකින් එකකට එළඹිය හැකි වෙයි.

1 යම් දෙයකට අදාළ අල් කුර්ආන් වාක්‍යයේ නියම තේරුම අපි තවමත් හරිහැටි වටහා නොගත්තෙමු. නැතහොත්

2. ඊට අදාල විද්‍යාත්මක මතය හරි නැත. ඒ කරුණ සම්බන්ධව විද්‍යාව තුළින් අවශ්‍ය තරම් පර්යේෂණයක් තවමත් කර නොමැත.

මම මෙම පොත් පිංචයෙහි ඉස්ලාමය සහ විද්‍යාව අතර මත භේදයට ලක් වූ කරුණු එකක් දෙකක් විමසුමට ලක් කිරීමට කැමැත්තෙමි.

මිනිසාගේ සම්භවය සිදුවුයේ කෙසේද?

මෙම විශ්වය ඇතිවුයේ කෙසේද?

අනෙකුත් සත්වයින් බිහිවුයේ කෙසේද?

යන කරුණු මම මෙහි විමසුමට ලක් කරමි. මෙය මතුවට මුස්ලිම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තවතවත් පර්යේෂණ පැවැත්වීමට උදව් විය හැකි බව විශ්වාස කරමි.

මේ අතර මෙහි වැදගත් කරුණක් නැවතත් මතක් කරනු කැමැත්තෙමි. එනම් ‘මිනිසා වානරයාගෙන් පැවැත එන්නෙකි‘ යන පරිණාමවාදය අද වනතෙක් ඇත්තේ ‘මතයක්‘ ලෙසින් පමණි. ඒ හැර එය ඔප්පු කරන ලද විද්‍යාත්මක සත්‍යයක් නොවේ. ඇත්තෙන්ම එය යම් කරුණක් විස්තර කිරීමට මනඃකල්පිතව ඇති කරගත් අදහසක් පමණි. එබැවින් තවත් බොහෝ පර්යේෂණවලට එය භාජනය විය යුතුව තිබේ. එවැනි පර්යේෂණ රැසකින් ඔප්පු වූ පසුවට, එය ඔප්පු වූ සත්‍යයක් ලෙස හෝ විද්‍යාත්මක සොයා ගැනිමක් ලෙස පිළිගත හැකිවනු ඇත. එසේ ඔප්පු කරනු ලබන සත්‍යයක් අපි කිසිවිටක ප්‍රතික්ෂේප නොකරන්නෙමු.

අපි මෙහි සාකච්ඡාවට ගන්නේ මෙනයින් විද්‍යාඥයෝ ගෙන ඇති තීරණ හා එම තීරණවලට පදනම් වූ දර්ශනයන්ය.

මිනිසා වානරයන්ගෙන් පැවත එන බව පවසන මතය ගැන සාකච්ඡා කිරීමට පෙර විද්‍යාව සම්බන්ධව තවත් කරුණක් දැන ගැනීම අවශ්‍යයි.

සත්‍යය කුමක්ද? අසත්‍යය කුමක්ද? යහපත කුමක්ද? අයහපත කුමක්ද? යන තීරන ගැනීමෙහි විද්‍යාව භාවිතයට ගන්නා උපකරණය 'විද්‍යාත්මක ක්‍රමය'(Scientific Method) නමින් වේ. පටහිර විද්‍යාඥයෝ හොඳ නරක තෝරා බේරාගන්නේ මෙම 'විද්‍යාත්මක ක්‍රමය' උපකාරයෙන්ය. මෙම ක්‍රමය බටහිර රටවලද භාවිතයට ගනු ලැබුවේ සියවස් එක දෙකකට පෙර සිටයි. ඊට පෙර මෙම ක්‍රමය භාවිතයේ නොතිබුණි. මෙය හෙට දවස වෙනස් විය හැකිය. මේ වෙනුවට වෙනත් ක්‍රමයක් භාවිතයට ගත හැකිය. එබැවින් මෙම විද්‍යාත්මක ක්‍රමය තරමක් පුළුල්ව දැනගැනීම වැදගත් වේ.

සෑම අවස්ථාවකම සෑම කාල පරිච්ඡේදයකම මිනිසුන් අතරට අලුතින් පිවිසෙන මතයකට විශේෂ පිළිගැනීමක්, ගෞරවයක් තිබී ඇත. අද සත්‍යය හා අසත්‍යය තෝරා බේරා ගැනීමට විද්‍යාව කුමන ක්‍රමයක් භාවිතා කරන්නේද එම ක්‍රමය පොදුවේ මිනිසුන් අතර පවතින අදහස්වලට අනුකූල වෙයි.

ඇත්තෙන්ම සත්‍යය හා අසත්‍යය තෝරා බේරා ගැනීමේ සුදුසුකමක් මෙම ක්‍රමයට නැත. එයින් පැහැදිලි වන්නේ "සත්‍යය හෝ අසත්‍යය මෙයයි" යනු නියම වශයෙන් තීරණය

කිරීමේ සුදුසුකමක් විද්‍යාවට හෝ එයින් ලබා ඇති මිනුම් උපකරණවලට හෝ නැති බවයි.

විද්‍යාව කුමන මිනුම් උපකරණයකින් සත්‍යය හෝ අසත්‍යය මනින්නේ ද හොඳ නරක වෙන්කොට පෙන්වන්න තැත්කරන්නේද එම මිනුම් උපකරණ යෙන්ය. එම මිණුම් උපකරණය නොයෙක් අඩුපාඩුවලින් යුක්ත වේ. මෙලෙස එම මිනුම් උපකරනයම අඩුපාඩුවලින් යුක්ත වන විට එයින් කෙරෙන මැනීම් කෙසේ නිවැරදි විය හැකිද?

අනුවේදනීය කරුණක් නම් නොයෙක් අඩුපාඩුකම් වලින් යුක්ත වූ එම මිනුම් උපකරණය, භාවිතා කොට විද්‍යාව සත්‍යය හා යහපත මැනීමට පෙළඹීමය. මෙසේ මනින විට මෙම මිනුම් උපකරණයට ග්‍රහණය නොවන යමක් වේ නම් එය අසත්‍ය බවට නිගමනය කොට ප්‍රතික්ෂේප කිරීම එහි ක්‍රියා මාර්ගයයි.

යමක් දෑසින් බලා දෑතින් අල්ලා හැඟීමෙන් දැනගත හැකි නොවන්නේද එය (තිබෙන බවක්) විද්‍යාව විසින් පිළිගනු නොලැබේ. මෙයින් පෙනී යන්නේ විද්‍යාත්මක තීරණ වැරදෙන සුළු බවත් එහි අරමුණ ඉතා පටුවූ බවත්ය.

විද්‍යාත්මක මිනුම් උපකරණවලටද මිනිසාගේ බැල්මට හා හැඟීම්වලටද ග්‍රහණය නොවන දේ අප්‍රමාණය. අනන්තය. මෙම සත්‍යය අප විසින් කෙසේ විස්තර කොට පැහැදිලි කර දුන්නත් විද්‍යාව විසින් පිළිගනු ලබන්නේ නැත.

ලොව අද පවතින දේ වුවද මතු දිනවල බිහිවන දේ වුවද ඒ සියල්ලක්ම තම උපකරණවලට ග්‍රහණය වන බව විද්‍යාව පවසයි.

තම උපකරණවලට ග්‍රහණය නොවන කිසිවක් මේ මිහිපිට නොතිබිය හැකිය. ඇතැම් විට එසේ යමක් තිබුනහොත් එය මනඃකල්පිත ලොවෙහි පමණක් විය හැකි බව විද්‍යාව තර්ක කරයි.

විද්‍යාවේ මෙම තර්කය කෙරෙහි සිත යොමු කරන සාමාන්‍ය පොදු ජනයා, විද්‍යාඥයින් උගත් වූ නමුත් නුගත් අය මෙන් තර්ක කිරීම ගැන විමතිය පලකරති.

අපේ සාකච්ඡාව පටන් ගැනීමට පෙර තවත් කරුණු දෙකක් කෙරෙහි අපේ අවදානය යොමු විය යුතුය.

1. විද්‍යාව තම දැනුම හා උපායවලට ලක්කොට ඇති ලෝකය කෙසේ වුවක්ද යනු වටහා ගත යුතුයි.

2. මෙම ලෝකය වෙත විද්‍යාව ළගා වන්නේ කුමක් පදනම් කර ගෙනද යනු වටහා ගත යුතුයි.

ලොව පවතින සෑම සංස්කෘතියකටම අයත් ජනයා පරස්පර වෙනස් වූ කෝණ තුළින් ලොව වෙත ළංවෙති. එමෙන්ම හොඳ නොහොඳ ගැන යම් තීරණ ගැනීමටද ඔවුන්ටම ආවේනික වූ මැනීමේ උපකරණ තබා ගෙන සිටිති.

අද අපි ආඩම්බරයෙන් ප්‍රශංසාවට ලක් කර ඇති ‘විද්‍යාත්මක වටය‘ ද මෙම ලොව දෙස බලන්නේ එයටම ආවේනික වූ බැල්මකිනි. මෙම විද්‍යාත්මක යුගය බටහිර රටවල්වල උපත ලැබුවකි. මෙම යුගය උපත ලැබූ අවස්ථාවෙහි කිතු දහම බටහිරයෙහි බලය අහිමි වී අභාවයට පත් වී සොහොන් බිම් කරා නිහඬව ගමන් ගෙන සිටියේය. එකල කිතු දහම කෙරෙහි

කිතුනුවන්ට ඇති වූ විරෝධතාවය නිසාම, ආගම් හා ආගම් තුළින් ඉගෙන්වෙන දේවත්වයට විරුද්ධව, ඔවුන් සටන් කිරීමට පටන්ගෙන සිටියහ.

“මිනිසාට කළ නොහැකි දෙයක් නැත. ඔහු බලසම්පන්නයි. ඔහුට කිසිවකුගේ උදව්වක් හෝ උපකාරයක් අවශ්‍ය නැත.“ යන මමත්වය එම ජනයාගේ සිත්තුළ පතිත වී ගෙන තිබුනි. මෙම කවියෙකු පැවසුවේ මෙසේය.

“මමයි මගේ දෛවයේ ස්වාමියා

මමයි මගේ ආත්මයේ නායකයා“

මෙවැනි හිතුවක්කාර කමකින් යුතුවයි විද්‍යාඥයන් මෙලොව හා මෙහි අඩංගු සියල්ල පර්යේෂණය කරන්න පටන් ගත්තේ. සත්‍යය අසත්‍යය හා හොඳ නොහොඳ සියල්ල තෝරා බේරා ගැනීමේ උපකරණද සොයාගෙන ඇත්තේ මෙම පදනම මුල්කර ගනිමිනි. මෙම විද්‍යාව කර ඇති පර්යේෂණ හා ඒවා තුළින් සොයා ගෙන ඇති නිගමන, විද්‍යාව මෙලොව ගැන දරන අදහස් කුමක්ද යනු පිළිබිඹු කරයි.

විද්‍යාව ලොව ගැන දරන අදහස්වලටත් සත්‍යය හා යහපත දැනගැනීමට ලබාගෙන ඇති උපකරණවලටත් එකිනෙක අතර ඉතා කිට්ටු සම්බන්ධ තාවයක් ඇත. ඒවා එකකින් තවෙකක් ඇත් කිරීම කිසිසේත් නොකළ හැකිය.

මෙම සත්‍යය සෑම මුස්ලිම්වරයෙක්ම අනිවාර්‍යයෙන් දැන සිටිය යුතුයි. බහුතර ජනතාවගේ තත්ත්වය කුමක්ද යත් රටේ පොදු වුත්, ජනතාව අතර ව්‍යාප්ත වී පවතිනවුත්, මතිමතාන්තර

එලෙසම පිළිගැනීමයි. එහෙත් බොහෝ විට සත්‍යය මෙම මතිමතාන්තරවලට ඉඳුරා වෙනස්ව පවතින බව දැකගත හැක.

අපි මුස්ලිම්වරන් වශයෙන් යම් අදහසක් සත්‍යද නැතිනම් අසත්‍යද යනු තිරණය කළ යුත්තේ අල්ලාහු තආලා අනාවරණය කළ අල් කුර්ආනය පදනම්කොට ගෙනය. නියම මිනුම් උපකරණය මෙයයි. මානව වර්ගයාට පිහිටවන යහපත ගෙන දෙන එකම මිනුම් උපකරණය මෙය වෙයි.

බටහිර විද්‍යාඥයන්ගෙන් බොහෝ දෙනෙක් ‘දෙවියෙක් නැත‘ යන මතය දරන්නෝ වෙති. මිනිසාගේ සම්භවය සිදුවුයේ කෙසේද යනු ඔවුහු විස්තර කරන්නේද මෙම මතය පදනම්කොට ගෙනයි. ඔවුහු කරන විස්තර කෙරෙහි ඔවුනට පරිපූර්ණ විශ්වාසයක් ඇත්නම් ‘ඔවුහු අදේවවාදීන්‘ බව එයින් සනාථ වෙයි.

මොවුහු මිනිසාගේ සම්භවය ගැන දෙන විස්තර සියල්ල ‘දෙවියෙකු නැත‘ යන අදහසට අනුකූලව ඇත්තේය. ‘දෙවියෙකු ඇත‘ යන අදහස නිකම් කථාවකට පවා පිළිගැනීමට ඔවුහු සූදානම් නැත. ඔවුන්ගේ කියන, කරන කිසිවක දෙවියන්ට කිසිදු සම්බන්ධතාවයක් නැත. විද්‍යාඥයෝ මෙම අදේවවාදය පදනම්කොට ගෙන, ඉතා පටු සීමාවක් තුළ යම් යම් අනුමානයන් කරති. පසුව ඒවා එලෙසම පිළිගෙන ක්‍රියා කරති. ඔවුන්ගේ (සාධක නොමැති) ඇදහීම් අතර මෙම ලොව ස්භාවයෙන් පිහිටි බව කීමත් එකකි. මෙය අන්ධ විශ්වාසයක් බව කිව යුතුයි. රටේ පවතින අන්ධ ඇදහීම්වලින් මෙයද එකකි. මක්නිසාද යත්, මෙය කිසිදු පර්යේෂණයකින්

තොරවුවක් වීමයි. මෙයට කිසිදු සාධකයක්ද නැත. ඇත්තෙන්ම මෙය පුහු මනඃකල්පිත ඇදහීමකි.

දෙවියෙක් නැති බව වාද කරන මෙම අදේවවාදීන්, දේව ඇදහීම ඇති අයගේ ප්‍රතිපත්තිය මෝඩ ඇදහිල්ලක් යනු පවසති. එහෙත්, අදේවවාදීන්ගේ ඇදහීම ඉස්ලාමය පවසන සත්‍යයන් තුළින් බලන කල, මහා මෝඩකමක් බව පැහැදිලි වෙයි.

මෙම ලොව ඇතිවුයේ කෙසේද? මිනිසාගේ උපත සිදුවුයේ කෙසේද? විද්‍යාව කුමක් පවසන්නේද? යනු බහුතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැන සිටිය හැකිය. එහෙත් එය නොදන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා එහි සාරාංශය ඉතා ලුහුඩින් සඳහන් කරනු කැමැත්තෙමි.

1. වායුව හා දූවිලි මිශ්‍ර වී බිහිවුණු අංශු විසිරී භ්‍රමනය වන ග්‍රහයන් බවට පත්විණ. මෙම පොළොවද මෙම විශ්වයෙහි පවතින අනෙකුත් ග්‍රහයන්ද බිහිවුයේ මෙතුළිනි.

2. පොළොව බිහි වූ පසුව, නැතහොත් පොළොව බිහිවෙමින් තිබියදී රසායනික හා විද්‍යුත් බලය සංයෝග වී, කිසියම් ද්‍රව්‍යයක් ඇති කළේය. මෙතුළින් ජීවය ඉබේටම බිහිවුණි. පසුව ඒ ජීවින් වර්ධනය වී ව්‍යාප්ත වීමට පටන් ගැනිණ.

3ත ඉතා සියුම් පළමු ජීව සයිලයෙන් පසුව සයිලවලින් බහුල වූ ජීවින් බිහිවුහ.

4. මෙවැනි සයිලවලින් බහුල වූ ජීවීන්ගෙන් සමහරක් මුහුදින් එගොඩ වී උරගයින් ලෙස ගොඩබිමෙහි තම ජීවිතය පටන්

ගත්හ. තවත් සමහරක් ජීවීන්, පක්ෂීන් බවට පත්වී ජීවිතය පටන් ගත්හ. යම් යම් අවස්ථාවන්හි ඉබේටම ඇති වූ ඇතැම් වෙනස්වීම් හේතුකොට ගෙන, උරගයින් පක්ෂීන් සහ තවත් සත්වයින් බිහි වූහ. මෙම වෙනස්වීම් දරාගත නොහැකි ජීවීන් මිය ගියහ. මෙම වෙනස්වීම් දරාගැනීමට තරම් හැකියාවක් පැවැති ජීවීන් බොහෝ කල් ජීවත් වූහ. ඒ සමගම බොහෝ පැටවුන්ද, තමතමන්ගේ වර්ගයාද බෝ කළහ. වසර ලක්ෂ ගණනාවක් යත්ම ඒ ඒ ජීවීන් තවත් ජීවීන් ලෙස බෙදී ව්‍යාප්ත වූහ.

5. උරගයින්ගෙන් පැටව් දා, කිරි දී, පෝෂණය වන සත්වයින් බිහි වූහ. මෙසේ හැදී වැඩී පෝෂණය වන සත්වයින්ගෙන් එක් විශේෂ සත්ව වර්ගයක් ඇති වූනේය. මෙම සත්ව වර්ගයා ගස්වල පමණක් ජීවත්වූයේය. මෙම වර්ගයා පෙනුමෙන් වඳුරන් මෙන් විය. කල්යත්ම මෙම වර්ගයා ගස්වලින් බැස භූමිතලයෙහි ජීවත් වන්නට පටන් ගත්තේය. කාලයාගේ ඇවෑමෙන් මෙම වර්ගයා ඇවිදීමට තම අත් යොදා ගැනීමෙන් මිදී කෙළින් සිටගන්නට විණ. කල්යත්ම ඇවිදීමට අත් යොදා ගැනීම සම්පූර්ණයෙන් අතහැර දැමීය.

6. මෙසේ ආවිදින කල අත් භාවිතා කිරීම නතර වූවායින් පසුව ඇතැම් උපකරණ භාවිතා කිරීමේ අත්දැකීම් මෙම වානරයින්ට අවස්ථානුකූලව ලැබිණ. මෙම අත්දැකීම ඔවුන්ගේ කල්පනා ශක්තිය වර්ධනය වීමට තුඩු දුන්නේය. ඉතා අධික කලකට පසු එම වර්ගයා මිනිස් රුව ලැබුවේය. ඉනික් බිතිව ඔවුන් කල්පනා කිරීමටද කතා කිරීමටද ඉගෙන ගත්හ. එහෙත් එම වානර වර්ගයාගේ යම් යම් හැසිරීම් මෙම මිනිස් වර්ගයා වෙතද

තිබුණේය. තවත් දිගුකලක් යත්ම මෙම වානර හැසිරීම් මිනිස් වර්ගයාගෙන් ඈත් විණ. ඉක්බිතිව අංග සම්පූර්ණ මිනිසා බිහිවුයේය. මෙම මිනිසා ඈත අතීත පැරණි යුගය පසුකොට, බුද්ධිය හා ශිෂ්ඨාචාරය අතින් දියුණුවීමට පටන් ගත්හ. මෙසපතෝමියා හා ඊජිප්තු ශිෂ්ඨාචාරයන්ට ඔහු උරුමක්කාරයා වූහ. පසුව ලියන්න, කියවන්න හැකියාව ලබා ගත්හ. මෙසේ ලිවීමට හා කියවීමට ඉගෙනගත් දා පටන්, ඔහුගේ චරිතය ලියවුණි, එය සැමෝටම ලැබෙන්නේය

මිනිසාගේ සම්භවය සම්බන්ධව විද්‍යාඥයින් ලබා දෙන්නේ මෙවැනි විස්තරයකි.

විද්‍යාව, මැවීම් සියල්ල පිටුපස මැවුම්කරුවෙක් සිටී යන්න පිළිගන්න පසුබට වෙයි. මිනිසා කෙසේ මවනු ලැබුවේද යනු සම්බන්ධව, අල් කුර්ආනය ගෙන දෙන විස්තර පිළිගැනීමටත් එය සූදානම් නැත .

මෙවැනි අවස්ථාවකදී මුස්ලිම්වරුන් වශයෙන් අපි කළ යුත්තේ කුමක් ද?

අල් කුර්ආනය මේ ගැන කුමක් පවසන්නේද යන්න ගැඹුරුව පරීක්ෂ කර බැලිය යුතුයි. එහි නියම අර්ථය කුමක්ද යනු වටහා ගන්නටද උත්සාහ කළ යුතුයි. එවිට ව්‍යාජ අදහස්වලින් බේරී සිටිය හැකි වෙයි. ඇත්ත ලොවට පහදා දීමටද හැකි වෙයි.

පළමුව:

සියළු දෙයක්ම නිර්මාණය කළේ අල්ලාහ්ය. ඔහුමය අහස් හා පොළොවද නිර්මාණය කළේ යනු අල් කුර්ආනය පවසයි.

අල්ලාහ්ය, මෙලොව අදියර හයකින් නිර්මාණය කළ බව හෝ අදියර හයක් වූ කාලයන්හී නිර්මාණය කළ බව කුර්ආනය පවසයි. එහෙයින් මෙලොව ඉබේම ඇති වූවක් නොවන බවත්, යම් සැලැස්මක් මත නිර්මාණය කළ බවත් පැහැදිලිය.

දෙවනුව:

අල්ලාහ්මය රූපය නොහොත් හැඩය දෙන්්නා. ජීවින් හා අනෙකුත් දේවල හැඩය, එවායෙහි හැසිරීම් රටාව හා ස්වභාවයද දෙනු ලැබුවේ ඔහු විසින්මය. අල්ලාහ්,තමා අභිමතවූ දෙයක් අභිමතවූ රූපයකින් මැවීමේ ශක්තිය ඇත්තෙකි. සෑම දෙයකටම, සෑම ජීවියකටම, ලබා දී ඇති ස්වභාවයට හා හැඩයට ආවේනික වූ යම් පැහැදිලි අරමුණක් ඇත. මෙම ගුණාංගයන් හා හැඩය නිකමට දෙනු ලැබූ ඒවා නොවේ. කෙටියෙන් පවසන්නේ නම්, මවන ලද සියලූ දෙයකටම අනිවාර්යයෙන්ම යම් හේතුවක් හා අරමුණක් ඇත. කොයි දෙයක් වුවත්, ජීවයක් වුවත් හේතුවක්, අවශ්‍යතාවයක් නොමැතිව මවනු ලැබුවේ නැත. මෙම ගුණාංග හා ස්වභාවයන් එම ජීවින් වෙත ඉබේටම ඇතිවූ වන්ද නොවේ. තවද එම ජීවින්, තමන්ගේ උත්සාහයෙන් මේවා ලබා ගත්තේද නොවේ.

තෙවනුව:

අල්ලාහ් ආරක්ෂකයා වෙයි, පෝෂණය කරන්නා වෙයි, සම්පාදක හා ජීවත් කරවන්නා වෙයි, ලොව පවතින ජීවින් මවා, එම ජීවින් කෙසේ හෝ ජීවත් වුවදෙන් යනුවෙන් ඔහු අතහැරියේ නැත. අල්ලාහ් තමා මැවූ ජීවින්ගේ හැසිරීම් රටාවට

ඉතා වැදගත් ස්ථානයක් දුන්නේය. මේ ගැන ශුද්ධ වූ අල් කුර්ආනය සුළුවෙන් හෝ දැන සිටින අය පවා දන්නෙහිය. බොහෝ අවස්ථා වන්හී අපේ කල්පනා ශක්තිය ප්‍රබෝධමත් කිරීමට, දෙවි තෙමේ තමා මැවූ දෙයහි ඇති ස්වභාවය කෙරෙහි දිවුරා අදහස් ප්‍රකාශ කරයි. ඒ තරම් මෙම ස්වභාවයට අල්ලාහ් වැදගත් ස්ථානයක් හිමිකර දි ඇත.

කුර්ආයේ තිබෙන ඉතා කුඩා පරිච්ඡෙද කියවා බලන්න. එවිට මේ ගැන වූ සත්‍යය ඔබට අවබෝධ වේ. පහත සඳහන් කුර්ආන් වැකි උදාහරණ වශයෙන් ගෙන හැර දැක්වේ.

*'අත්තික්කා සහ ඔලිව්හිද සිනායි කත්දේද මේ අභය දායි (මක්කා) නගරයේද නාමයෙන්.'* 95- 1සිට 3 දක්වා

*'හතිදමා (කුරයෙන්) ගිනි පුපුරු විසුරුවා දුවන (අශ්වයන්ගේ) නාමයෙන්.'* 100 -1 සහ 2

*'(නබි තුමනි) ඔබව නිර්මාණය කළාවූ විශ්වයාධිපතිගේ නාමයෙන් හදාරවූ. ඔහු මිනිසා සණ ලේ කුටියකින් මැව්වේය. හදාරවූ. ඔබගේ ස්වාමියා අති උදාරයි.'* 96 -1 සිට 3 දක්වා

*'සූර්යයා හා සූර්ය ලෝකයද එය ලුහු බැඳ එන චන්ද්‍රයාගේද නාමයෙන්.'* 91 -1 සහ 2

මෙහි අල්ලාහ් කුමක් තහවුරු කරන්නේද යනු මඳක් සිතා බලන්න. ඔහු ඔහුගේ මැවීම් කෙරෙහි, දී ඇති අනර්ගවත් ගුණාංග වෙත අපගේ සිත් යොමු කරවයි.

තවත් දෙයක් අල්ලාහ් මෙහි අපට පැහැදිලි කරයි.

ඉහත සඳහන් ඔහුගේ මැවීම්හී ඇති ගුණාංග කිසිවක් එහි මැවීම්වල උත්සාහයෙන් ලබාගත් ඒවා නොවෙයි. තවද, ඒවා ඉබේටම ඇතිවූ දේද නොවෙයි යන්න අල්ලාහ් නොකියාම කියන සත්‍යයකි.

ඒවායෙහි පෙනෙන විශේෂ ගුණාංග හා ස්වභාවය සෑම දෙයක්ම දෙනු ලැබුවේ අල්ලාහ් විසින්මය. මෙයද මෙයින් මතුවන තවත් සත්‍යයකි.

අල්ලාහ් මෙසේ පවසයි.

*'ඔබගේ විශ්වයාධිපති මීමැස්සන්ට මෙසේ හැඟීම් පහළ කෙළේය. කඳු ගස් හා උස් ගොඩනැගිලි (වාසස්ථාන) වල මීවද බැඳගනු. සියලු පළතුරු (වලින්) අනුභව කරනු. නුඹේ ස්වාමියා පහසු කළ මගින් ගමන් කරනු. තවද ඔවුන්ගේ උදරයන්ගෙන් වර්ණවත් පානයක් වැහෙන්නේය. එහි මිනිසාට සුවය ඇත. නියත වශයෙන්ම නැණවතුන්ට එහි පැහැදිලි සාධක ඇත.'* කුර්ආන් 16 – 68 සහ 69.

මිනිසාගේ උපත සිදුවුයේ කෙසේද යන්න පවසන වාක්‍ය බොහෝ සේ කුර්ආනයේ දක්නට ඇත. එම වාක්‍ය තුළින් පහත සඳහක් තීරණ ගත හැකිය.

1. අල්ලාහ්, මිනිසාව කිරි මැටියෙන් නිර්මාණය කළේය.

2. අල්ලාහ්, තම ආත්මයෙන් මිනිසාට ප්‍රාණය දුන්නේය.

3. අල්ලාහ්, මිනිසාට කථා කිරීමට ඉගැන්වුයේය. ඒ සමගම ඥනය ලබා දුන්නේය.

4. අල්ලාහ්, මිනිසාට බැලීම, සවන්දීම සහ හැඟීම යනා දී ශක්තීන්ද පිරිනැමුවේය.

5. අල්ලාහ්, මිනිසාට ආත්මය දුන්නේය. එයට හොඳ නරක හා හරි, වැරදි අවබෝධ කරගැනීමේ හැකියාව හා බුද්ධියද දුන්නේය.

6. අල්ලාහ්, පළමුව එක් පුද්ගලයෙකු නිරිමාණය කළේය. ඔහුගෙන් ඔහුගේ සහකාරිය නිර්මාණය කළේය. මෙම අඹු සැමි යුවල ගෙන් මානව සංහතිය මෙලොව ව්‍යාප්ත විය.

මිනිසාගේ උපත ගැන විද්‍යාඥයින් කරන විස්තර කෙරෙහි යොමු වන කවර අය හෝ මේවා ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීම අවශ්‍යය. මේවා අපි දැඩි ලෙස විශ්වාස කළ යුතුය. මක්නිසාද යත් මේවා ශුද්ධ වූ කුර්ආනයේ සඳහන්වන සත්‍යයන්ය. අල් කුර්ආනය විශ්වය හා එහි පවතින සියල්ල මැවූ අල්ලාහ් අනාවරණය කළ ශුද්ධ වචනයන්ගෙන් සමන්විත ග්‍රන්ථයක් හැර අනෙකක් නොවේ. මැවුම්කරුවාට, කුමක් මැවුවේද? කුමක් සඳහා මැවුවේ ද? යනු මනා දන්නේය.

මිනිසාගේ උපත ගැන අරුම පුදුම වූ විස්තරයක් දීමට මම මෙහි නොපැමිණියෙමි. මිනිසාගේ උපත ගැන කුර්ආනය ඉදිරිපත් කරන කරුණු විද්‍යාඥයන්ගේ අනුමානවලට හෝ අදහස් වලට වඩා බුද්ධියට එකග වන බව සඳහන් කිරීමට කැමැත්තෙමි. තවද සදාකාලීන ජීවිතයේ අත් දැකීම්ද ‘කුර්ආනයේ පවසන කරුණු සත්‍ය වේ‘ යනු සනාථ කරන බව මෙහි පෙන්වා දීමට කැමැත්තැමි.

2. මෙම විශ්වයේ සම්භවය

මෙම විශ්වයේ සම්භවය සම්බන්ධව විද්‍යාඥයින් දැන ඇති කරුණු ඉතා අල්පය. ඔවුන්ට ලැබී ඇති දත්ත විශ්වාස කිරීමට සුදුසු ඒවා නොවේ. මේ සම්බන්ධව මොවුහු තවමත් පරිපූර්ණ දැනුමක් ලබා ගෙන නැත. මොවුහු තමන් ලබාගෙන ඇති ඉතා අඩු තරම් දත්ත තබාගෙන සියල්ලක්ම දන්නා මෙන් විද්වතුන් තීරණය ගනිති.

විද්‍යාඥයින් මෙම විශ්වයේ සම්භවය ගැන කරුණු සියල්ලම දැන ගැනීමට නොහැකිවීමටත් හේතු ඇත.

1. විශ්වායේ සම්භවය ගැන දැනගත යුතු කරුණු රාශියක් ඇත. ඒ සෑම දෙයක්ම දැනගන්න තරමට විද්‍යාත්මක පහසුකම් තවමත් වර්ධනයවී නැත.

2. මෙම ලොවෙහි සම්භවය සිදුවූයේ දීර්ඝ කාලයකට පෙරය. ඒ තරම් ඈත අතීක කාලයකට පෙර වූ කරුණු දැනගන්න තරමට විද්‍යාත්මක උපකරණ ශක්තිමත් නොවේ. තවද විද්‍යාවද එතරම් දුරට වර්ධනයවූයේ නැත.

විද්‍යාඥයින් ඉතා ඉක්මනින් යම් යම් ප්‍රතිපත්තීන් හා න්‍යායයන් බිහි කොට ලොවට හඳුන්වති. එහෙත් කල් යත්ම එම ප්‍රතිපත්ති හා න්‍යායයන් හඳුන්වා දුන්නට වඩා වේගයෙන් අසත්‍ය බව පවසා ප්‍රතික්ෂේප කරති. මින් පෙනී යන්නේ ඔවුන්ගේ තීරණ බොහෝ විට විශ්වාස කළ නොහැකි බවය.

උදාහරණයක් මෙසේය:

“මෙම විශ්වයට කියා යම් සම්භවයක් තිබුනේම නැත. මෙලොව, සෑම කලකම මෙසේම තිබී ඇත. මෙහි අනන්ත අප්‍රමාණා ජීවින් නැතිවීද ගොස් ඇත.“

වසර 20කට පෙර දක්වා මෙම විද්‍යාඥයින් මෙම ප්‍රතිපත්තිය අදහා වැඳ වැටී සිටියහ. පසුව, මෙම ප්‍රතිපත්තිය ඉවතලා වෙනත් ප්‍රතිපත්තියක් අදහන්නට වුහ. එනම් වායුව හා දූවිලි එක්වී පිපිරී සුණු විසුණු වූ කල, මෙම ලෝකය බිහි වූ බවයි. මෙම “බිග් බෑං“ (Big Bang Theory) න්‍යායය යනු ඔවුහු නම් කළහ.

මෙම න්‍යායය ගවේෂණය කළ විද්‍යාඥයින් දෙදෙනාම සත්‍යය සොයා වටහා ගත් බව කිව නොහැකිය. ඇත්තෙන්ම, ඔවුන්ගේ ගවේෂණය සත්‍ය නොවේ. මෙයින්, දැනුම් අතින් ඉතා විශිෂ්ට තැනක් උසුලන මහත් විද්‍යාඥයින්ට පවා වැරදෙන දේ ඇති බව වටහාගත හැකිය. මහත් විද්‍යාඥයින් බව ප්‍රකට වුවත් පවා වැරදි මතයක් දිය හැකි අවස්ථා ඇති බව වටහා ගත යුතුයි.

දෙවන උදාහරණය:

සතියකට දෙකකට පෙර “නිව්ස් වීක්“ සඟරාවෙහි තිබුණු සටහනක් මෙහි ගෙන දැක්වීම උචිතය. එනම් විද්‍යාඥයින් දැන් අලුත් දෙයක් ගවේෂණය කොට ඇති බවයි. එය වෙනකක් නොව‘ ඔවුන් මේතාක් මෙම විශ්වයේ බවට ඇදහු යම් මතයක් දැන් අසත්‍ය බව ගවේෂණය කොට දන් සිටීමයි. එනම්, ඔවුන් මේතාක් මෙම විශ්වයේ වයස බවට සඳහන් කරගෙන ආ වර්ෂ ගණනෙහි දෝෂයක් ඇතිවී තිබේලු.

එම නිවැරදි වයස (විශ්වයේ වයස) ඔවුන් සඳහන් කළ ගණනින් අඩක් පමණ ඇතිලු.

මෙම විශ්වය සම්බවය ගැන විද්‍යාඥයින් මේ වනතෙක් පවසා ආ අදහස් සියල්ලම වැරදිව තිබී ඇත. ඔවුන් මේ සම්බන්ධව අඛණ්ඩව නොයෙක් වැරදි කරගෙන ඇවිත් ඇත. මෙනයින් අපි පැහැදිලි නිගමනයකට පැමිණිය හැකිය. එනම්, නියත වශයෙන්ම මෙම විද්‍යාඥයින් තමන්ට දැනුම නැති නොයෙක් දේ කෙරෙහි අනුමානයෙන් පමණක් ගෙන, ඒවා 'මහත් පරිමාණයේ පර්යේෂණ නිගමනයන්' ලෙස එළිදරව් කිරීමයි.

දැන් මෙම විද්‍යාඥයෝ "මෙම විශ්වය, මහත් පිපිරීමක් තුළින් බිහිවුවක්ය" යනු පවසති. කුමන දෙයක් පිපිරීම හේතුකොට ගෙන, මෙසා විශාල විශ්වයක් බිහිවුයේද? පිපුරුණු දෙය කුමක්ද? කිසිවක් නැති තත්ත්වයක පිපිරීම ඇතිවිය නොහැකිය. යමක් තිබුනොත් පමණි පිපිරීමක් ඇතිවන්නේ, ඒ දේ සුණුවිසුණු වී යන්නේ. ඒ දෙය කුමක්ද? එය කෙසේ ඇතිවුයේද? එය ඇතිවීමට හේතුවුයේ කුමක්ද? ඔවුන් කියන 'එය දෙය' පිපිරීමට අවශ්‍ය ශක්තිය කුමක්ද? එය ලැබුනේ කෙසේද? මෙම දෙය හා ශක්තිය යන දෙක, තමන්ව තමාව මවා ගත්තේද? මෙවැනි ප්‍රශ්න ඉදිරියේ විද්‍යාඥයන් නිහඬව සිටිති.

අපි දකින සෑම දෙයකම ඉතා සියුම් පරමාණු රැසක් ඇති බව කියන්නෙමු. ඒ අනුව නොයෙක් වාද විවාදයන්ද පවත්වන්නෙසු. එහෙත්, මේ පරමාණු කොහෙන් පැමිණියේද?

කෙසේ බිහි වුයේද? යන්න සම්බන්ධව කිසිදු විද්‍යාඥයකු ගෙන් නියම විස්තරයක් නොලැබිණ.

මේ ගැන ඔව්හු කිසිවක් නොදනී. මේ හේතුවෙන්, ඔවුහු යමක් නොකියන්නේ නම්, ඔවුන්ට සමාව දිය හැකිය. ඔවුන්ට නොදන්නා කිසිවක් ගැන අපි දොස් නොකියමු. එහෙත්, බොහෝ විද්‍යාඥයින් තමන්ගේ ගෞරවය රැකගන්නේ නැත. ඔවුහු ඔවුන්ගේ පණ්ඩිතකම පෙන්වන්න, යම් යම් මනඃකල්පිත කරුණු හා හේතුන් සිතෙහි මවා ගෙන, ඒවා සත්‍ය බව පෙන්වනු සඳහා වාද කරන්නෝය. මෙලොව මැවූ දෙවි කෙනෙක් ඇති බව පිළගන්න ඔවුහු සූදානම් නැත. එහෙයින්, ඔවුන් පරමාණුව හා එයින් බිහිවූ අනෙකුත් දේ කෙසේ ඇති වූයේද, යන්න සම්බන්ධව යම් යම් පුදුමාකාර විස්තර දෙන්නේය.

ඔවුන්ගේ විස්තර අනුව. පරමාණුව හා එයින් ඇති වූ දේ සියල්ල තමන්ව තමන්ම ඇතිකර ගත් බව වේ.

ඔවුන් වටින් පිටින් වාද කළත්, මනඃකල්පිත හේතුන් පෙන්වුවත්, එයින් දැක්වෙන්නේ, නැත්නම් නිගමනය කරන්න උත්සාහ දරන්නේ, මෙම විශ්වය ඉබේටම ඇතිවූවක් යන්නයි. මෙම විද්‍යාඥයින් නිකුත්කරන වාර්තා හා ඔවුන්ගේ ලිපි තුළින් පිටවන අදහසද මෙයම වේ. අනුවේදීනීය කරුණක් නම්, බටහිරයේ වෙසෙන උසස් පෙළේ ජනතාව, විද්‍යාඥයන්ගේ ඔප්පු නොවූ, මෙම අන්ධ විශ්වාසයන් ගැන මඳක් හෝ සිතා බලන්නේ නැත. විද්‍යාඥයන් පවසන සියල්ල, සත්‍ය බව එකහෙලාම පිළගනිති. කෙසේ කිතු දහම බලගතුව තිබියදී, එම ආගමික පූජකවරුන් ආගමේ නමින් පැවසූ අසත්‍ය සියල්ල

අන්ධ භක්තියෙන් යුතුව, කිසිදු පැකිලීමකින් තොරව පිළිගත්තේද එසේම විද්‍යාඥයන් බවසන අනුමානයෙන් යුතු වූ සියල්ල සත්‍ය ලෙස පිළිගන්නට පෙළඹී සිටිති.

මුස්ලිම්වරුන්ට මෙම ප්‍රශ්න කිසිවක් නැත. ඔවුන්ගේ මනස, මේ කිසිවක් සම්බන්ධව කිසිදු චලනයකට ගොදුරු වී නැත.

මැවුම්කරු වූ අල්ලාහ් සර්වඥ වෙයි. හෙතෙම, ඉතා කාරුණික වෙයි. එබැවින් ඔහුව, එකම දෙවි ලෙස පිළිගෙන, ඔහුගේ අණ පිළිපැද ජීවත්වන්නන් මෙවැනි චලනයන්ට ගොදුරු නොවී සිටින ලෙස දේව වදන් තුළින් අවවාද කරනු ලැබ සිටිති.

මෙ හේතුව කරන කොටගෙන මුස්පිම්වරුන් ඉස්ලාම් ධර්මයට පටහැනි වෙනත් මතයක් හෝ ප්‍රතිපත්තියක් ඔස්සේ ගොස් නොමග යන අභාග්‍ය තත්ත්වයෙන් බේරාගනු ලැබ සිටිති.

## 3. ජීවය හා ජීවීන්ගේ සම්භවය

අපි සාකච්ඡා කරන දෙවනි කරුණ වන්නේ ජීවීන් හා ජීවින්ගේ සම්භවයයි.

“මෙලොව ඇතිදේ ද, ශක්තියද, මෙලොවේ කි්‍රයාකාරිත්වයද. ඉබේටම ඇතිවුවන්ය. පසුව, වසර කෝටි ගණනාවක් යත්ම (අපි අද දකින) කෝටි සංඛ්‍යාත තාරකාවලින් විශ්මිත එකක් බිහි විය. (එයයි සූර්යයා) සූර්යයා

නම් වූ මෙය වටේ ග්‍රහයන් නවයක් භ්‍රමණය වෙමින් තිබිණ. එම ග්‍රහයන් එකක (පොළොවෙහි) ය ජීවින් ඇතිවුයේ.

බටහිර විද්‍යාඥයන් අපට අදහන්න කියනුයේ මෙම හාස්‍ය ජනක කථා පුවතයි.

පළවුවෙන් මෙම ජීවය හා ජීවින් ඇතිවුයේ කෙසේද යනු ප්‍රශ්න කළොත්, ''ජීවය හා ජීවින් ඇතිවීමට හැකි පරිදි වු පරිසරයක් තිබිණ. කාල ගුණයද බොහෝ සේ යහපත්ව හා සාධකව තිබිණ. ආලෝකයද අවශ්‍ය ප්‍රමාණයෙන් තිබිණ. වායු මණ්ඩලයද, ජීවින් ඇති වීමට සරිලන තත්ත්වයක තිබිණ. මෙම අවස්ථාවෙහි, ශක්තිය, ස්වභාවයෙහි වු රසායනික ද්‍රව්‍ය සමග මිශ්‍ර වී, රසායනික වෙනස්කම් ඇති වු හෙයින් බැක්ටීරියා හා අනෙක් ජීවින් ඇතිවිණ. ඔවුහු (ස්වභාවයෙන්ම ලැබුණුදේ) අනුභව කළෝය. පානය කළෝය. බහුලව බෝවී, තම වර්ගයා වර්ධනය කළෝය. ඔවුහු තමන් මෙන් වු බොහෝ ජීවින්, ලොවෙහි බිහි කිරීමෙන් පසු මරණයට පත්විණ. මෙම ජීවින්ගේ වර්ධන ක්‍රමය, හෙවත් බෝවීම. මෙලොව ඇති තාක් කල් අඛණ්ඩව පැවැත්වෙනවා ඇත. පළමුව ඇති වූ රසායණික වෙනස්කම්ද, මෙහි අඛණ්ඩව පැවැත්වෙයි. මෙයට කිසිම බාහිර ශක්තියක් හේතු නොවෙයි. මෙම ජීවින් ඇතිවීමටද කිසිදු වැදගත් හේතුවක් නොමැත. එමෙන්ම, මෙයට කිසිදු විශේෂ අරමුණක්ද නැත'' යනුවෙන් පිළිතුරු දෙන්නේය.

රැල්ලෙන් පිරුණු මහ මුහුද, එහි ජීවත්වන මාලූ වර්ගයන්, මහ ඝන වනාන්තර, එහි ජීවත්වන දහස් ගණන් පුදුමාකාර සත්වයන්, ඉමක් කොනක් නැති අහස, එහි පියාසර කරමින් ජීවත්වන පක්ෂීන් හා අනෙකුත් ජීවින්, මහපොළොවට

තොරන් බඳින ලස්සන මල්, වල් පැලෑටි, දිස්වූ සෑම තැන්හිම කොළපාට ඇතිරිල්ලක් දිග හැරියා මෙන් පෙනෙන තණ බිම, රන් පැහැ හිරු එළිය දෙන සන්ධ්‍යා අහස, මද සුළගෙ, ඉමිහිරි සුවය යනාදී මේ සෑම දෙයක්ම, සෑම මොහොතකම, බලා සතුටුවන මිනිසා. තම ලස්සන හැඩරුව ඇතුළු අනෙක් සියල්ලම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔහුගේ අනුවණකම ගැන කුමක් කියන්නද?"

"මේ සෑම දැයක්ම ඉබේටම ඇතිවූවන්ය. මේවා මැවීමෙහි කිසිදු අරමුණක් නොමැත." යනු තර්ක විතර්ක කරන මිනිසාගේ මන්ද බුද්ධිය කුමන නමකින් හඳුන්වන්නද?

විද්‍යාඥයන් අපට අදහන්න කියන මේ අනුවණට අදාළ සියල්ලක්ම, ඉස්ලාමය විසින් මුළුමනින්ම ප්‍රතික්ෂේප කොට ඇත.

*"අහස්වලද, මහපොළොවෙහිද ආධිපත්‍යය, අල්ලාහ් සතුය. සියලූ දෑ කෙරෙහි අල්ලාහ් බලසම්පන්නය. අහස් සහ මහපොළොව මැවීමේදීත්, දිවා රාත්‍රී පරස්පරානු ගමනයෙහිත්, මනා සිහි බුද්ධියෙන් පසුවන අයට (දැක ගත හැකි) සංඥාවන් බොහෝ ඇත. මොවුහු හිටගෙන, හිඳාගෙන, හෝ හාන්සිව සිටින, සියලූ අවස්ථාවන්වල අල්ලාහ් සිහි කරති. තවද, අහස් හා මහපොළොව නිර්මාණයේ (විශ්ව ජනකයේ) මෙනෙහි කරති. ඔවුන් (මෙසේ) පවසති. අපගේ පරමාධිපතියාණනි, ඔබ මේ සියල්ල්ම මවා ඇත්තේ හුදෙක් පරමාර්ථයක් නැතිව නොවේ. ඔබ සුචි ශුද්ධය. අප අපායේ ගින්නේ වදයෙන් මදවා ගනු මැන."* (අල් කුර්ආන් 3-189 සිට 191 දක්වා)

4. පරිණාම වෘද්ධිය

දැන් අපි, පරිණාම වෘද්ධිය නම් වූ න්‍යායය කෙරෙහි අපගේ සිත යොමු කරමු. එක වර්ගයක් හෝ ජාතියක් තුළ (පරිණාම) වෘද්ධියක් ලබන බව, ඇතැම් කුර්ආන් වාක්‍ය පෙන්වා දෙන්නේය. උදාහරණයක් වශයෙන්, පහත් සඳහන් වාක්‍ය උපුටා දැක්විය හැකිය.

*"මිනිසුනි, අපි ඔබ සෑම, එක් ස්ත්‍රී, පුරුෂ යුගලයකින් නිර්මාණය කළෙමු. තවද දැන හැඳින ගනු පිණිස, (පිළිකුල් කිරීමට නොව) අපි ඔබ සෑම ජාතීන් හා ගෝත්‍රික යන් කළෙමු."* (අල් කුර්ආන් 49 - 13)

මිනිසුන් සියල්ලෝම එකම දෙමාපියන්ගෙන් උපත ලැබුවෝ වන්නාහ. එනමුත්, ඔවුහු වර්ණයෙන්, බුද්ධියෙන් හා ගුණාංගයන් ගෙන් කෙනකු තවත් කෙනකුගෙන් වෙනස් වී ඇති බව පෙනෙන්නේය. මෙයින් වැටහෙන්නේ එකම වර්ගයා හෝ ජාතියක් තුළ විවිධ ගුණාංග ඇතිවීම ස්වාභාවික බවයි.

මෙය වෙනත් වචනවලින් පවසන්නේ නම් එකම වර්ගයා තුළ පරිණාම වෘද්ධියක් සිදුවිය හැකිය. එහෙත්, විද්‍යාඥයන් තර්ක කරන අන්දමට පරිණාම වෘද්ධිය හේතුකොට ගෙන සමුපූර්ණයෙන්ම වෙනස් වූ පුදුමාකාර වර්ගයක් ඇතිවිය නොහැකිය.

මම ඉහත සඳහන්කොට ඇති කුර්ආන් වාක්‍යයෙන් තවත් දෙයක් වටහාගත යුතුය. එනම් මොනතරම් වෙනසක් ඇති වුවත්, ඒ වෙනස්කම් සියල්ල කෙරෙන්නේ අල්ලාහ්ගේ නියමය සහ කැමැත්ත අනුවය. අල්ලාහ්මය එම වෙනස්කම සියල්ල ඉටු කරන්නේ.

සතුන්ගෙන් යම් විශේෂ වර්ගයක් ලබාගත යුතු නම්, ඒ වර්ගය තෝරා ගෙන, එයට ඔබිනා අන්දමින් ආහාර සපයා ඇති කරන ක්‍රමයක් ප්‍රායෝගිකව ඇත. මෙය කවුරුත් දන්නා කරුණකි.

උදාහරණයක් වශයෙන් වේගයෙන් දුවන අශ්වයන් සහ යම් විශේෂ වරගයක සුනකයින් ගැන කිය හැකිය. යම් විශේෂ ක්‍රියා පිළිවෙළක් යෙදවීමෙන් පසුව, තමන්ට උවමනා වන උසස් වර්ගයකට අයත් අශවයින් හෝ සුනඛයින් ලබාගන්නේය. මෙම විශේෂ ක්‍රියාපිළිවෙළ නොකළේ නම්, (වෙනස් වූ වාතාවරණයක් ඇති තැන්හි) මෙම උසස් වර්ගයා නොඉපදෙයි. මේ ගැන කිසිවකු විසින් කිසිදු හේතුවක් කියන්නට නොහැකිය.

මෙලෙස, උෂ්ණය අධික ප්‍රදේශයන්හි ජීවත් වන එළුවන්, උතුරු යුරෝපයේ හිම පටලය පවත්නා ප්‍රදේශයන්හී, එම තත්ත්වය සපුරා ගැන, එකම එක දවසක් ජිවත්වීම පවා දුෂ්කර බව අපි දනිමු. එමෙන්ම යුරෝපයේ ශීතකර පෙදෙසක ඇති දැඩිවී එම වාතාවරණයට හුරු පුරුදුවූ බැටළුවන්, උෂ්ණ ප්‍රදේශයන්හි එක දවසක් හෝ ජීවත්වීම අති දුෂ්කරය. එළුවන් වශයෙන් මොවුනතර වෙනසක් නොමැත. එහෙත්, ඔවුන් ගන්නා ආහාර හා අනෙකුත් සෑම අතින්ම ඔවුනොවුන් ගේ

වාතාවරණයට සරිලනසේ ජීවත්වීමට පුරුදුවීම හේතුවෙන්, ඊට හාත්පසින්ම වෙනස් වූ තත්ත්වයක ජීවත් වීම කළ නොහැකිව ඇත.

මෙලෙස පරිසරයට එකගව, තම ජිවිතය සකසා ගැනීමට හෝ වෙනස් වූ පරිසරයක් දරාගත හැකි අන්දමින්, ඔවුන්ගේ ශරිරය සුදුසුව පිළියෙළ කර ගැනීමට ඔවුන්ට ඉගැන්වුයේ කවුද? එය අල්ලාහු තආලා, තම කාරුණිකත්වය තුළින් ලබාදුන් වරප්‍රසාදයකි.

ජීවීන් එකම ක්‍රමයකින් හැසිරීමට, “රොබෝ“ නම් වූ පණ නැති යන්ත්‍ර නොවේ. පණ ඇති ජීවින් වේ. ඔවුන්ගේ වර්ගයා වර්ධනය වන විට, පැටව් බිහි කරන විට, පැටවුන් අතර විවිධත්වයක් ඇතිවීම ස්වභාවයකි.

උදාහරණයක් වශයෙන්, එක් අඹු සැමි යුවලකට දරුවන් දස දෙනෙක් සිටින බව කියමු. ඒ දරුවන් දස දෙනාම මිනිස් වර්ගයා වෙති. එහෙත්, දරුවන් දස දෙනාම ගුණයෙන්, වරණයෙන් හා හැඩ හුරුකමින්, එකවගේ සිටිතැයි බලාපොරොත්තු විය නොහැක. එසේ නැති බවත් අපි කවුරුත් දනිමු. එම දරුවන් වෙත නොයෙක් වෙනස්කම් ඇති බව අපි දනිමු. දෙවි තෙමේ ලබා දී ඇති මෙම වෙනස්කම් තුළින්, ඔවුන් ජීවත්වන ස්ථානය හා එහි ඇති පරිසරය යනාදියට අනුව තමන්ව සකස් කර ගැනීමේ ගුණාංග පසුව වර්ධනය කර ගැනීමට හැකිවන්නේය. මෙය අල්ලාහ්ගේ අප්‍රමාණවත් දායාදයන් ගෙන් එකකි.

මෙහි, මම යමක් ඉතා පැහැදිපිව කියන්න කැමැති වෙමි. එකම වර්ගයක් තුළ ඇතැම් පරිණාම වෘද්ධියන් ඇතිවිය හැකිය. එය අපි ප්‍රතික්ෂේප නොකරමු. පිළිගනිමු. එහෙත් පරිණාම වෘද්ධිය තුළින්, සම්පූර්ණයෙන්ම වෙනස්වූ ගුණාංග හා ශරීර ලක්ෂණ ඇති සහමුලින්ම වෙනස් වු වර්ගයක් ඇති වෙයි යනු කිසිකලෙක පිළිගත නොහැකිය. එසේ සිදු වී නොමැත. මෙතෙක් අපට ලැබී ඇති සාක්ෂිවලට අනුව මෙය ඔප්පු වී ඇත. තමද මෙය අත්දැකීම් තුළින් අප දන්නා සත්‍යයක්ද වෙයි.

පොළොවේ දීර්ඝ පැවැත්ම තුළ ඇතැම් ප්‍රදේශවල, සම්පූර්ණ යෙන්ම වෙනස් වූ වර්ගයේ ආශ්චර්යමත් සතුන් බිහි වී ඇත. මොවුන් දැක විද්‍යාඥයින් පවා කම්පනයට පත්වුහ.

තවද, එවකට ජීවත් වූ එක් සත්ව වර්ගයෙකුගේ ආටසැකිලි විද්‍යාඥයින් විසින් සොයා ගන්නා ලදී. එහෙත්, මෙම සත්ව වර්ගයා බිහිවීමට තවත් සත්ව වර්ගයක් හේතු වූ බවට පවසන කිසිදු සාධකයක් සොයා ගෙන නැත. මේ සත්ව වර්ගයාගෙන් මෙම සතුන් බිහිවුයේ යයි කීමටද, කිසිදු සාධකයක් නැත. මොවුන් සම්පූර්ණයෙන්ම වෙනස් වූ මැවීමක් බව කිව යුතුයි. මෙය, කිසිදු පෙර ආදර්ශයක් නොමැතිව යමක් මවන ශක්තිය අල්ලාහු තආලාට තිබෙන බව සනාථ කරයි.

එහෙයින්,පෙර හා පසුව නොමැති සතුන්ද, මුතුන් මිත්තන් නොමැති සතුන්ද, පරිණාම වාද්ධි වටයට අයත් නොවන සතුන්ද, සම්පූර්ණයෙන්ම වෙනස් වූ ගුණාංග හා ගතිගුණ ඇති සතුන්ද කෙසේ බිහිවුයේද යනු සිතා බලනු වටී.

නියත වශයෙන්ම මේ සියල්ල මවන එක් අසමසම උතුම් විශිෂ්ට ශක්තියක් තිබිය යුතුමය.

මෙම ශක්තිය විද්‍යාඥයන් පිළිගැනීමට සූදානම් නැත. මේ අතර, නොයෙක් ජීවීන්ගේ බිහිවීම සම්බන්ධව, ඔවුන් විසින් නියම කරුණු ගෙන දැක්වීමටද අපොහොසත්වී සිටිති. මෙම තත්ත්වයෙහි, ජීවීන් කෙසේ බිහිවුයේද යන්න සම්බන්ධව, පිළිවෙළක් නැති එකිනෙකට පටහැණි නොයෙක් අදහස් ගෙන දක්වති. ඒවා අනවශ්‍ය විවාදයන්ය. එකිනෙකාට පටහැණි වුවන්ය. මූලික වූ නොයෙක් ප්‍රශ්නයන්ට පිළිතුරු සැපයීමට නොහැකි වුවන්ය.

විද්‍යාඥයන්, තම පරිණාමවාදයට පක්ෂව ගෙන දක්වන ඇතැම් ජීවීන්ගේ ගුණාංගයන් ගැන, මඳක් ගැඹුරුව විමසා බලමු.

සෑම සතෙක්ම, තමන්ට එරෙහිව එන පහරදීම්වලින් වැළකී මට, ඒවා පරාජය කිරීමට, යම් උපායක් යොදන බව අපි දනිමු.

- මුවා, තමා බේරාගැනීමේ ක්‍රමයක් වශයෙන් වේගයෙන් දුවයි.

- ඉබ්බා, තම කවචය තමාට එන පහරදීම් වලින් බේරීම සඳහා පළිහක් ලෙස භාවිතා කරයි.

- කටුස්සා, තමා බේරා ගැනීමට තම වර්ණය වෙනස් කිරීමේ කලාව පෙන්වයි.

- හූනා තම වලිගය කඩා දමා තමා පහර ලද්දෙක් බව පෙන්වා පැන දුවයි.

- විෂකූරු සර්පයා, භයානක විෂ තමාගේ ආරක්ෂාව වෙනු වෙන් බාවිතා කරයි.

- මුහුදේ වෙසෙන බූවල්ලා, තමා ආරක්ෂාකර ගැනීමට විචිත්‍ර වූ උපායක් යොදයි. එනම් තම සතුරා දුටු විට යම්කිසි (තීන්ත වැනි) වර්ණයක් දියෙහි කලවම් කරන්නේය. මෙයින් දියේ වර්ණය සම්පූර්ණයෙන්ම වෙනස් වෙයි. මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන එතැනින් පලා යයි.

- ඉත්තෑවා, තම ශරිරය ගැස්සීමෙන් ශිරීරයේ ඇති ඉත්තෑ විදිමින් තම සතුරාට අනතුරු හගවයි.

- වවුලා, තම සතුරා දුටු විගස හඳුනාගෙන අයින් වෙයි.

- දියේ ජීවත්වන ආඳා, (Electric eel))තමා අල්ලන්න තැත්කරන්නාව විදුලිය මගින් කිසියම් තිගැස්සීමකට ලක් කරයි.

මෙම ආත්මාරක්ෂක උපායන්හී තැන්පත් වී ඇති ඥානය අප්‍රමාණය, අපරිමිතය.

විද්‍යාඥයන් පවසනවා මෙන්, මේ සෑම සතෙක්ම පිළිවෙළින් හෝ සූදානමක් නැතිව ඉබේටම බිහි වූයේද? එම සතුන්ගේ ආත්මාරක්ෂක සැලැස්ම, ඔවුන් තුළ ඇති කළේ කවුද? ඇත්තෙන්ම, මෙම සෑම පිළිවෙළක්ම ඔවුන්ව මැවූ දෙවි තෙමේ, ආරම්භයේදීම සැලසුම් කොට ඔවුන්ට දී ඇති බවයි සත්‍යය.

"මේ සියල්ල ඉබේටම ඇති වුවන්ය. යම් යම් අවස්ථානුකූලව සිදුවූ වන්ය. ජීවීන්ගේ ජීවිතයෙහි ඇති වූ යම් විපකත් හේතුකොට ගෙන මේවා ආතිවිණ" යන තර්කයන් සියල්ල, පිළිගත හැකිද?

මිනිසා තම තියුණු බුද්ධිය පාවිච්චි කර සොයාගෙන ඇති යුධ උපායන්ටත් වඩා ශ්‍රේෂ්ඨවත්ව පිහිටා ඇති මෙම ආත්මාරක්ෂක ක්‍රම ස්වභාවයේ අන්ධභාවයෙන් වූ සිදුවීමකින් සොයාගනු ලැබුව්ද? මේ දේ මෙලෙසම පිළිගන්නා ලෙස පැවසුවහොත් මොලේ ඇති කෙනෙකු, සිතට එකගව පිළිගන්නේ කෙසේද?

අල්ලාහ් තමන්ගේ මැවීම් ගැන අධ්‍යයනය කරන්න කියා අපෙන් ඉල්ලා සිටින්නේ, නිකමට නොවේ. ඒවාහි තැන්පත් වී ඇති විශ්මිත කරුණු තුළින් අපගේ නුවණැස විවෘත කිරීම පිණිසයි.

අපි ඉහත පෙන්වා දී ඇති ආත්මාරක්ෂක උපායන්, කිසිදු ඥානයක් නැති මේ සතුන් කිසිවකුගේ උදව් උපකාර නොමැතිව, තමන්ම සොයා ගෙන තම ශරීරයේ අලවා ගන්නේද?

මෙවැනි කිසිදු සාක්ෂි නැති, බුද්ධියට එකග නොවන දේ අදහන ලෙස විද්‍යාඥයන් කියනවාලු, අපි ඇදහිය යුතුයිලු . ඇත්තෙන් මෙම විද්‍යාඥයින් අපගෙන්, ප්‍රමාණයටත් වඩා අනුවණකම බලා පොරොත්තු වන්නේය. ඇතැම් විද්‍යාඥයන් මෙම විතර්ක අත් හරින්නේම නැත.

තර්කයක් වශයෙන් මෙම කරුණ අපි මෙහි සඳහන් කරමු.

වඳුරු රැළක් යතුරු ලියනයක් ඉදිරියේ ඉඳ, එහි ඇති අකුරු වලට තට්ටු කරන බව සිතා ගනමු. වසර ගණනාවක් මොවුන් එම අකුරුවලට මෙසේ තට්ටුකිරීමේදී, අහම්බෙන් හෝ වචනයක් දෙකක් සැදෙන්න පුළුවනි. එහෙත්. මොවුන් වසර ගණනාවක් එම අකුරුවලට තට්ටු කිරීමේ හේතුවෙන් බ්‍රිටානිකා විශ්ව කෝෂය සකස් කළ බව යමෙක් පැවසුව හොත් එය පිළිගන්නේ කෙසේද? එවැන්නක් ඔවුන්ට සකස් කළ හැකි ද? ඒ සඳහා වු කල්පනා කිරීමේ ශක්තියද, භාෂාව ගැන වූ ඥානයද, විෂය ඥානයද ඔවුන්ට තිබෙන බව වාද කළ හැකිද? එසේ කීමෙහි සත්‍යතාවයක් ඇත්තේද? එවැනි ඥානයෙන් පිරුණු වඳුරන් කොහේ යරි සිටින බව හෝ සිටිය බව හෝ කිව හැකිද?

මේසා විශාල විශ්වයද, එහි ඇති රම්‍යතාවය, උසස් පිළිවෙළ හා ක්‍රියා කාරිත්වයද කිසිදු අරමුණක් සැලැස්මක් නැතිව පමණක් නොව, මෙය මැවු කෙනෙක්ද නොමැතිව ඉබේටම ඇති වූ බව පැවසීමට හැකිද?

සතුන්ගේ ශාරීරික ලක්ෂණ හා ඒවායෙහි ඇති හැගීම් ගැන හොඳ හැටි පර්යේෂණ කළවුන්, මේ සියල්ල ඉබේටම හෝ යම් අවස්ථාවක නිකම්ම ඇති වුවත් නොවන බව හෝ වටහා ගෙන සිටිති. එම මැවීම්වල පිටු පසින් ඉතා ගැඹුරු ඥණයක් ඇති, බලගතු ශක්තියකගේ බල පරාක්‍රමය යෙදී ඇති බවත් ඉතා පහසුවෙන් වටහාකත හැකිය. එහෙත්, මේ බටහිර විද්‍යාඥයන් එවැනි ශක්තියක් ඇති බව පිළි නොගනිති.

'ස්වභාවය' යනු, ඔවුහු අමතන දේ හි යටපත් වී ඇති අනන්ත අප්‍රමාණ දේ ගැන යමෙක් අඛණ්ඩව පර්යේෂණ පැවැත්වුව හොත්, එය කොපමණ අරුම පුදුම දේ සැඟවී ඇත්තේද යනු වටහා ගන්නවා ඒකාන්තයි. මේ සියල්ල කෙසේ ඇති වුයේද යනු අපි පර්යේෂණයක් පැවැත්වුවහොත්, ඒ සැම දෙයක්ම මැවූ කෙනෙක් සිටීම අනිවාර්ය බව අපි තීරණය කරනවා මයි, – එහි සැකයක් නැත.

යුරෝපයේ (Cuckoo) කොවුලා නම් වූ පක්ෂීන් වර්ගයක් සිටිති. මෙම පක්ෂියා, තමාට කියා කූඩුවක් තනා නොගනියි. කොවුලාගේ ගැහැණු සතා, බිත්තර දැමීමට අවශ්‍යවූ විට, එය තමාගේ බිත්තරවලට සමාන හැඩරුව ඇති වෙනත් පක්සීන්ගේ කූඩු සොයා ගනියි. පසුව, එම කූඩුව අයිති පක්ෂියා පිටවී යනතෙක් බලා සිටියි. එම පක්ෂියා පිටවු විගස කොවුලා තම බිත්තර, එම කූඩ්වල දමා පියාඹා යන්නේය.

එම කූඩුව අයිති පක්ෂියා නැවත පැමිණි විට, එහි ඇති කොවුලාගේ බිත්තරද තම බිත්තර බව සිතා, රැවටී එම බිත්තරද රකින්න පටන් ගනී. මෙම කොවුලාගේ පැටව්ද ඉතා දක්ෂය. මෙම පැටව් බිත්තරවලින් එළියට පැමිණි විට, එහි තිබෙන අනෙක් බිත්තර සියල්ල ඉවතට තල්ලු කර දමයි. යම් බිත්තරයකින් පැටව් එළියට පැමිණ සිටියොත් එම පැටව්ද ඉවතට තල්ලු කර දමයි. ඇත්තෙන්ම ඉවතට තල්ලු කළ බිත්තර හා එයින් බිහිවු පැටව් එම කූඩුවේ නියම උරුමක්කරුවෝය. පසුව, එම කූඩුවේ හිමි පක්ෂියා ආහාර සපයන්නේ සහ දිවා රෑ වෙහෙසන්නේ, මෙම කොවුල් පැටියාටමයි. මෙම කොවුල් පැටවු වේගයෙන් වැඩෙන්නේය.

වේගයෙන් වැඩෙන ඔවුන් කලක් යන විට එම කූඩුවෙන් පියාඹා නික්ම යන්නේය.

බටහිරයේ විද්ඥාන්ට, මේ ගැන කුමන විස්තරයක් දිය හැකිද? ඔවුන් අදහා වැඳ වැටෙන පරිණාමවාද මතයෙහි මෙයට යම් විස්තර යක් ඇත්තේද?

මෙම කොවුලා, තම කූඩුවේ බිත්තර නොදා, වෙනත් පක්ෂියකුගේ කූඩුවක බිත්තර දැමීමට දිරි දුන්නේ කවරකු විසින්ද? එම පක්ෂියා, තමාටම කියා කූඩුවක් තනා ගැනීමෙන් වැලැක්වූයේ කවරෙකු විසින්ද? සියලූම කොවුල් පක්ෂින් මෙසේ හැසිරිය යුතු බව ඉගෙන්වූයේ කවරෙකු විසින්ද? ඊට පෙර, කොවුල් පක්ෂින් තම බිත්තර රැකීමෙන් වැළකුවේ කවරකු විසින්ද? මේ සෑම දෙයක්ම හැර, වෙනත් පක්ෂියකුගේ කූඩුවේ බිත්තර දමා එම පක්ෂීන් තුලින්ම පැටව් බිහිකිරීමේ හැගීම එම පක්ෂීන්ට දුන්නේ කවරකු විසින්ද? මෙය මෙතරම් ඥානයකින් සැලසුම් කළේ කවරකු විසින්ද?

නියත වශයෙන්ම, මේ සියල්ල ක්‍රමවත්ව සැලසුම් කළේ අල්ලාහ් විසින්ය.

තවත් පුදුමාකාර උදාහරණයක් දෙස බලමු.

'ඉතා සමගිව කෙනකුට කෙනෙක් උදව් වී ගෙන එකමුතුව පිවත්වුව හොත් පමණි ජීවිතය රැකෙන්නේ' යන සංකල්පයක් මත ජීවත්වන ඇතැම් ජීවීන් ඇත. මෙසේ සමගිව ජීවත් වන එක් එක් ජීවියකටම යම් විශේෂ වැඩ කොටසක්, නැත්නම් කාර්ය භාරයක් ඇත. උදාහරණයක් වශයෙන්, කුහුඹුවන් හා මී මැස්සන් සඳහන් කළ හැකිය.

එකම වටයක් තුළ ජීවත්වන කුහුඹුවන් ගෙන්, එක් එක් කුහුඹුවකුටම එක් විශේෂ වැඩකොටසක් ඇත. ඒ වැඩකොටස ඉටුකරන විලසින්ම එම කුහුඹුවන් පුහුණු ලැබ ඇත. එ බැවින්, ඔවුන් තම ජීවිතය ගෙන යෑමට එකිනෙකා අතර බැඳීමෙන් හා සහයෝගී තාවයෙන් ජීවත් විය යුතුව ඇත. එසේ නොවේ නම්, ඔවුන් ජීවත්වීමට නොහැකිව මිය යති. ඔවුන්ගේ කාර්යයත් මෙසේ වෙති. ඇතැම් කුහුඹුවන්, පිටත ගොස් ආහාර රැස්කර ගෙන එයි. තවත් ඇතැමුන්, තමා ජීවත් වන ස්ථානය පිරිසිදුව තබා ගන්නා අතර, එය පුලුල් කරන කාර්යයෙහි යෙදෙයි. වෙනත් කුහුඹුවන් කොටසක්, තම රැජිණගේ අවශ්‍යතාවයන් ගැන සැලකිලිමත් වෙයි. සාත්තු සේවයේ යෙදී සිටින කුහුඹුවන් තම පැටව් යහපත් ලෙස හදා වඩාගන්නා කාර්යය ඉටු කරයි.

මෙලෙස, සෑම කුහුඹුවකුම තමාගේ කාර්ය භාරය නිසි ලෙස ඉටු කරයි. මෙම හැඟීම් හා වගකීම් ඉටුකිරීමේ අවනත භාවය, මෙම කුහුඹුවන් කොතැනින් ලබා ගත්තේද? එක් කුහුඹුවෙක් එක් කාර්යයක් හා අනෙක් කුහුඹුවෙක් වෙනත් කාර්යයක් ඉටු කළ යුතුය. ඒ හැර සියලුම කුහුඹුවන් සියලුම වැඩ කටයුතුවල නිරතවීමෙන් ඇතිවන්නේ විනාශයකි, වැඩ කටයුතු අවුල්වීමකි යන මෙම තියුණු ඥානය හා හැඟීම් ඔවුන් කොහෙන් ලබා ගත්තේද?

තවත් ඇතැම් කුහුඹුවන් සිටිති. මොවුන්ගේ හොටය ඔවුන්ට ඔවුන්ම ආහාර ගන්න බැරි අන්දමින්ද තමාගේ කූඩුව හදාගන්න බැරි අන්දමින්ද දික්වී ඇදවී ඇත. වොමුන් තමන් සතු වැඩකටයුතු කරගැනීමට වහලූන් තබා ගනිති. මෙම වහල්

කුහුඹුවන්ගේ උදව් උපකාර නැත්නම් මොවුන්ට අත්වන්නේ මරණයයි.

"සාමාන්‍ය පරිසරයක, තමාගේම ශක්තිය තුළින් කටයුතු කරගෙත හැකිවුවත් පමණක් ජීවත් වන්නේය" යනු පැවසූ පරිණාම වර්ධන මතය, අනෙක් කුහුඹුවන්ගේ උදව්වෙන්ම ජීවත් වන මෙම කුහුඹුවන් ගැන කුමක් කියන්නේද?

මෙම දුබල කුහුඹුවන්ට, ඒ වහල් කුහුඹුවන් උදව් විය යුතුය, යන හැඟීම් දී නොතිබුනේ නම් එම දුබල කුහුඹුවන් නැති වී යයි, නැසී යයි.

කුහුඹුවන්ගෙන් ඇතැමුන්, සේවකයන් ලෙස සේවය කරති, ඇතැම් කුහුඹුවන් එඬේරුන් ලෙස කටයුතු කරති. එනම්, ඇල්ෆිඩ්ස් (Alphids) නම් වූ කුඩා සතකු පාවිච්චියට ගෙන පැණි රසැති ද්‍රව්‍යමය යමක් මෙම කුහුඹු වන් ලබාගනිති. තවත් කුහුඹුවන්ගෙන් කොටසක්, මොවුන්ගෙන් ලැබෙන පැණිය එකතුකොට රැකබලා ගන්නා කාර්යයෙහි නිතර වී සිටිති.

මෙම විනෝද වූ කරුණු සියල්ල, ගැඹුරුව සිතා බලන යමෙක් මේ සියල්ල, ඉතා සියුම් ලෙස සැලසුම්කොට මැවූ කෙනෙකු සිටිය යුතුමයි යන්න පිළගන්නවා නියතයි.

"මේ සියල්ල ඉබේටම සිදුවන සිදුවීම්ය. කිසිදු හේතුවක් හෝ සැලැස්මක් නොමැතිව ඉබේටම සිදුවන දේය" යනු තර්ක කරන්නන්, සත්‍යය දැක ගැනීමට බැරිවුවන්ය, නැතහොත් මැවුම්කරුවා පිළිගැනී මට එරෙහිව, යම් යම් දේ දොඩවන අය බව කිව යුතුයි.

මී මැස්සන් ගැන සඳහන් කරන අල්ලාහ් තආලා, ශුද්ධ වූ කුර්ආනයේ මෙසේ පවසයි.

*"ඔබගේ පරමාධිපති, මීමැස්සන්ට මෙසේ හැඟීම් පහළ කළේය. කඳු, ගස් හා වාසස්ථානවල මීවද බැඳගනු. නොයෙකුත් පළතුරු අනුභව කරනු. නුඹේ ස්වාමියා පහසු කළ මගෙහි ගමන් කරනු. තවද ඔවුන්ගේ උදරයෙන් වර්ණවත් පානයක් වැහෙන්නේය. එහි, මනුෂ්‍යයන්ට සුවය ඇත, නියත වශයෙන්ම නුවණැත්තන්ට එහි පැහැදිලි සංඥා හා සාධක ඇත.*"අල් කුර්ආන 16: 68 සහ 69

'දෙවියෙක් ඇත. ඔහුමය මෙම විශ්වය හා මෙහි අඩංගු සියළු දේ නිර්මාණය කළේ', යන සත්‍යය විදහාපාන, මෙවන් උදාහරණ විශාල වශයෙන් දක්නට ඇත . එහෙත් ඇතැමුන්, මෙම සත්‍යය වසන් කිරීමට කොපමණ බොරු හා මනඃකල්පිත කරුණු සොයා යන්නේද? යන්න සිතනවිට එවැන්නන් ගැන ඇතිවන්නේ ඉමහත් කණගාටුවකි වේදනාවකි.

විද්‍යාඥයින්ගේ අනුවේදනීය තත්ත්වය විදහාපාන එක් කරුණක් දෙස බලන්න.

'ලස්සන', 'ආකර්ෂණය' යන වචනවලට විද්‍යාඥයන් දෙන විවරණය විචිත්‍රය, විනෝදාත්මය. ඔබ අතර ඇති ප්‍රකට වූ, ඕනෑම විද්‍යාව සම්බන්ධ වූ ග්‍රන්ථයක් ගෙන බලන්න. 'ලස්සන' ඇති වුවේ කුමක් සඳහාද, යන්නට පහත සඳහන් විස්තරය තිබෙනවා දැයි දැක ගත හැක.

මොනරාගේ තටුවල ඉතා අලංකාරවත් වර්ණය ඇත්තේ කුමක් සඳහාද යනු ඔබ දන්නවාද? එය, තමාගේ ගැහැණු සතා ආකර්ෂණය කිරීමටයි.

ඇතැම් පක්ෂීන්, ඉතා මිහිරි හඬක් ගෙන ඇත්තේ කුමක් සඳහාද යනු ඔබ දන්නවාද? තම ගැහැණු සතා ආකර්ෂණය කිරීමටයි. බවර් බර්ඩ් (Bower bird) නැමැති ඔස්ට්‍රේලියානු පක්ෂීන්, තමන් වෙනුවෙන් ලස්සන කූඩුවක්ද, එය අවට ලස්සන උයනක්ද තනා ගන්නේ කුමක් සඳහාද යනු ඔබ දන්නවාද? ඔවුන්ගේ ගැහැණු සතා තුරුල් කරගන්නටයි. 'හිබිස්කස් ෆ්ලවර්' (Hibiscus Flower) නම් වූ (ක්‍රමානුකූලව වැවෙන යම් වතු පැලෑටි) වර්ගය' ඉතා ලස්සන වර්ණය ලබාගත්තේ කුමක් සඳහාද යනු ඔබ දන්නවාද? රොන් ගන්න පැමිණෙන මැසි වර්ගයකට සංග්‍රහ කිරීමයි එහි අරමුණ වනුයේ.

රෝස මල් ඉතා අගනා සුවඳක් දෙන අතර සිත්කලු පැහැයින් පිරී තියෙන්නේ කුමක් සඳහාද යනු එබ දන්නවාද? මීමැස්සන් තමා වෙතට ඇද ගන්නයි.

මේ වනාහි විද්‍යාඥයන් 'ලස්සන හා ආකර්ෂණය' යන වචනවලට දෙන විස්තරයයි, විග්‍රහයයි. සාමාන්‍යයෙන් බැලූවහොත්, මෙම විස්තරන්හී යම් හරයක් ඇති බව පෙපෙයි.

මැග්පිස් (Magpies) නම් වූ යුරෝපිය පක්ෂියා දෙසද, ගිජුලිහිණියා (Vulture) සද බලන්න. මොවුන් ඉතාමත් පිළිකුල් සහගත පෙනුමෙන් යුක්තයි. මොවුන්ගේ හඬද, සවන් දෙන්නන්ට පිළිකුල් දෙන තරම් අමිහිරියි. ඔවුන්ගේ ක්‍රියාවන්ද ඉතා කෲරයි. ඔවුන් ජීවත්වන්නේ ද කිසිදු පහසුකම් නොමැති

ස්ථානයන්හිය. මෙසේ නොයෙක් අප්‍රිය, අමිහිරි තත්ත්වයක් ඇතත්, ඔවුහු තමන්ගේ ගැහැණු සතාව කිසිදු මහන්සියක් නැතිව ආකර්ෂනය කර ගනිති. තවද මඩෙහිද, පඳුරුවලද නොයෙක් වර්ගයේ මල් දකින්නට හැකිය. ඒවා සිතට ප්‍රිය ගෙන දෙන තරම් දැකුම්කලු නොවේ. එවා පිපෙන ස්ථානද ප්‍රිය නොවේ. එහෙත් මැස්සන් මේ මල් වෙත පියාඹා යන්නේය. ඒවාද කිසිදු අඩුපාඩුවක් නොමැතිව තම වර්ගය වර්ධනය කරන්නෝය.

විද්‍යාඥයි පවසන විස්තරයන් තර්කයකට පිළිගත්තද ඒවායින් කිසිදු ප්‍රශ්ණයකට පිළිතුරක් නොලැබෙන්නේය.

ජීවත්වීමට ලස්සන හා ආකර්ෂණය අවශ්‍ය නැත. එනමුත් මෙම මල් හා පක්ෂීන්, නමන් මේ තරම් අලංකාරවත් කරගන්නේද ආකර්ෂණය පෙන්වන්නේද කුමක් සඳහාද?

“ජීවත්වීමට අවශ්‍ය සියලු දේ ලබාගැනීමටයි, ලොව ඇති සියලු ජීවින් ජීවත්වන්නේ“ යන දාර්ශනික අදහසක් ගෙනදැක් වූ විද්‍යාඥයන් මෙයට දෙන පිළිතුරු කුමක්ද?

කිසිදු පිළිතුරක් නැත.

ඇත්තෙන්ම, මෙම පක්ෂීන් හා මල්වල ඇති අලංකාරය බලා රස විඳින්නේත්, සතුටුවන්නේත් කව්ද?

මේවායෙහි නියම රසය විඳින්නේ, මේවා මෙසා අලංකාරවත්ව මැවූ අල්ලාහ් හා ඔහුගේ විශිෂ්ට මැවිමක් වන මිනිසාත්ය.

එහෙත්, අල්ලාහ් තමාට පරිත්‍යාග කළ දැනුම හා දක්ෂතාවය මිනිසා වැරදිව පාවිච්චි කිරීමට පටන් ගත්තේය. එමගින් තමන්ව මැවූ මැවුම්කාරුවකු නැති බව වාද කිරීමට පෙළඹුනේය.

එහෙත්, කාරුණික දෙවියන් වහන්සේ, මිනිසාට සෑමවිටම තම ඇරයුම කරමින් සිටියි. එය අල් කුර්ආනයෙහි මෙසේ සඳහන් වෙයි

*පරම දයාලු (අල්ලාහ්, මෙම) කුර්ආනය ඉගෙන්විය. ඔහු මිනිසා නිර්මාණය කර ඔහුට කථිකත්වයද ඉගැන්විය.*

*ඉරත් සඳත් පරිගණිත(ව ක්‍රියාකරන්නේ) ය. තවද, ශාක පැළෑටි හා ගස් කොළන් (අල්ලාහ්ට යටහත්ව) සුජූද් කරති. ඔහු අහස එසෙව්වේය. ඔහු සමතුලනයද ස්ථාපනය කළේය. (මක්නිසාද යත්) නුඹලා තුලාවෙහි සීමාව නොඉකමවනු පිණිසය. තවද නුඹලා තුලාව සාධාරණ ලෙස පිහිටවවු. තුලනය අඩු නොකරවු. පෘථිවිය ඔහු ජීවීන් වෙනුවෙන් ස්ථාපනය කළේය. එහි විවිධ පළතුරු, වලූබර කෝෂයෙන් යුත් ඉඳිද (ඇත). දහයියාවලින් වැසුණු (විවිධ) ධාන්‍යද (වෛවර්ණ) සුවඳ පැළෑටිද ඇත. එසේ නම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්)ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂේප කරන්නෙහු ද?*

*වලන් මෙන් ශබ්ද ඇති කරන කිරි මැටියෙන් ඔහු මිනිසා නිර්මාණය කළේය, තවද ඔහු ගිනි දලූවෙන් (අමානුෂ්‍ය) ජින් (වර්ගයා ද) නිර්මාණය කළේය. එසේ නම්, නුඹලා සර්ව*

බලධාරි (අල්ලාහ්)ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නෙහුද?

ඔහු දෙ උදයෙහි හිමිකරුය. දෙ අස්තමනයෙහිද හිමිකරුය. එසේ නම්, නුඹලා කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නෙහුද?

ඔහු මුහුදු දෙක එක්වීමට සැලැස්විය. නමුත් ඒ දෙක අතර මායිමක් ඇත. එදෙක, එය ඉක්මවා නොයයි. එසේ නම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්) ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරනනේහුද?

එදෙකෙන් මුතු හා පබලූ හට ගැනේ. එසේනම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්)ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නේහුද?

තවද, මහ මුහුදෙහි පර්වත මෙන් තරණය කරන නැව් හිමිකරුද ඔහුමය. එසේනම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්)ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නේහුද?

මෙ(ම පෘථිවිය) මත ඇති සියලූ දෑ විනාශ වනු ඇත. එහෙත් මහෝත්තම අති උතුම් සර්වබලධාරි (අල්ලාහ්) පමණක් සදාතනිකය. එසේ නම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්)ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නේහුද?

අහස්හීද, පොළොවෙහිද ඇති සියල්ලන් (තමන්ට අවශ්‍ය දෑ) ඔහු ගෙන්ම අයැද සිටින්නෝය. සෑම හොමොතකම

*ඔහු අලුත් ක්‍රියාකාරිත්ව යෙහි යෙදී සිටියි. එසේනම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්) ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නේහුද?*

*අහෝ ලෝ වැසි (ජින් හා මිනිස්) දෙවර්ගයෙනි, අපි නුඹලාගේ පලහිලව්ව නිරවුල් කරන්නෙමුය එසේකිනම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්)ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නේහුද?*

*ජින් හා මිනිස් වර්ගයාණනි, අහස් හා පොළොවේ සීමාවන් ඉක්මවා යෑමට හැකිනම් ඉක්මවා යනු. මහත් බලයකින් (නොලබමින්) මිස, නුඹලා ඉක්මවා නොයන්නෙහුමය. එසේ නම්, නුඹලා සර්ව බලධාරි (අල්ලාහ්) ගේ කුමන අනුග්‍රහයන් නුඹලා ප්‍රතික්ෂෙප කරන්නෙහුද?“* කුර්ආන් 55- 1 සිට 34 දක්වා.

5. මිනිසාගේ සම්භවය

මිනිසාගේ සම්භවය සිදුවුයේ කෙසේද, යනු විද්‍යාඥයින් දෙන විස්තරය දෙස වරක් හැරී බලමු.

බටහිර රටවල්හි වෙසෙන විද්‍යාඥයන්, උරගයන් වැනි ජීවීන්ගෙන්, පැටව් දමා කිරි දී හදා වඩාගන්නා ජීවීන් හා පක්ෂීන් බිහි වූ බව වාද කරති.

පසුව, පැටවු දමා, කිරි දෙන ජීවීන්ගෙන් වානරයන් බිහි වුහ. එම වානරයන්ගෙන් මිනිසා බිහි වුයේය, යනු බටහිර විද්‍යාඥයන්, මිනිසාගේ සම්භවය ගැන දෙන විස්තරයයි.

ඔවුහු දෙන විස්තර සියල්ල කෙසේ වුවද එහි සාරාංශය මෙයයි.

'කුමන ජීවීන් විශේෂයෙක් තුළින් හෝ, කුමන අන්දමේ නව ජීවී විශේෂයක්, බිහි විය හැකිය. එක් සතකු, කාලයේ ආවෑමෙන් සම්පූර්ණ යෙන්ම වෙනස් වූ සතෙකු බවට පරිවර්තනය විය හැකිය.'

එහෙත්, ජීවීන්ගේ දීර්ඝ ජීවිත චරිතයෙහි, විද්‍යාඥයින් පවසන මෙම රසවත් කථාව ඔප්පු වී නැත. අද වනතුරුත් මෙයට අදාළ එකදු සාක්ෂියක් හෝ ලැබී නැත.

ඇතැම් ජීවීන්ට, වසර 50ක්ම ආහාර සපයා, ඉතා ප්‍රවේශමෙන් අභිජනනය කළ පසුවද, එම ජීවීන්ගෙන් කිසිදු නව ජීවී විශේෂයක් බිහිවු බවට දකින්න ලැබුනේ නැත. මෙම ජීවීන්ගේ වසර 50ක් තුළ 50වන අභි ජනන ක්‍රියාවලිය, මිනිස් වර්ගයාගේ පරම්පරා 1000ට සමාන වේ.

උසස් වර්ගයේ අශ්වයන් ලබාගන්න අපේක්ෂා කරන්නන් එක් විශේෂ අශ්ව වර්ගයකට අයත් අශ්වයකුට තවත් විශේෂ වර්ගයේ අශ්වයකු සමග සංසර්ගයේ යොදවයි. එයින් උසස් වර්ගයේ අශ්වයින් බිහි වේ. මෙ ඔවුන්ගේ වසර ගණනාවක ක්‍රියාවලියකි.

ඔවුන්ගේ අත් දැකීම අනුව, ඉපදෙන අශ්ව පැටවා ශ්‍රේණිය, වර්ණය, ගුණාංගය, යනාදියෙන් වෙනස් විය හැකිය. එහෙත් ඔවුන් අශ්වයන්මය. ඒ හැර ඔවුන් කිසිකලෙක, අශ්ව වර්ගයෙන් සම්පූර්ණව වෙනස් වූ වෙනත් වර්ගයක් වුයේ නැත කාලයාගේ ඇවෑමෙන් අශ්ව වර්ගයා වෙනස් වී, එළුවන් හෝ ගවයන් හෝ තවත් වර්ගයක් බවට පත් වුයේ නැත.

බූරුවෙක්, කලක් යනවිට අශ්වයකුව හෝ අශ්වයෙක්, කලක් යනවිට ඔටුවෙකු හෝ වෙනස් වූ බවට කිසිදු සාධකයක් නැත.

ඇතැම් විද්‍යාඥයින්, උතුම්කොට සලකන පරිණාමවාදයෙහි සත්‍යයක් ඇත්නම්, මහ වානරයා (Gorilla) සහ අප්‍රිකාවේ ඝන වනාන්තරයෙහි ජීවත්වන වලිගය නැති වානරයා (Chimpanzee) මෙම පරිණාමවාදය අනුව" මිනිසුන් බවට පරිවර්තනය වීමෙන් වැලෙක්වුයේ කුමක් ද? මෙම පරිවර්තනය සිදුවීමට අවශ්‍ය කාලයක් ඔවුන් ජීවත්වී ඇත. ඒ කියන්නේ, වසර ලක්ෂ ගණනාවක් ඔවුන් මෙලොවෙහි ජීවත් වී ඇත. එහෙත් ඔවුන් මෙම පරිවර්තනයට ලක් නොවුයේ මක් නිසාද?

එසේ නම් "පරිණාම වෘද්ධියට අයත් මතය අනුව ඔවුන් පවසන පරිවර්තනය අඛණ්ඩව ක්‍රියාත්මක වුයේ නැත. එම පරිවර්තනය යම් කාල සීමාවක් තුළ නිමාවකට පත් වේ. එය සෑම තැනකම ක්‍රියාත්මක වන්නේද නැත" යනු අදහස් වනවා නේද? මෙම චින්තන අවුල් ජාලය තුළට මිනිසා ගෙන ගොස් ඔහුට තව කොපමණ කාලයක් වද දෙන්නෙද?

මෙම සියළු විස්තරයන් අපව ගෙන යන්නේ 'ලොව පවතින සෑම සියළු ජීවීන්ම මවන ලද්දේ එකම දෙවියෙක් විසින්ය' යන තීරණයටයි. නියත වශයෙන්ම මෙම ලොව පවතින සජීවි අජීවි සියළු දෙයක්ම මැවුයේ එකම එක දෙවියකු විසිනි. එහි කිසිදු සැකයක් නැත. ඉනික්බිතිව එම මැවීම්වලට යම් යම් විශේෂ ගුණාංග දෙනු ලැබුවේය. මෙම ගුණාංග හා ඊට අදාල අනෙකුත් දේ, පසුව අප යම් පිළිවෙළක් කිරීමෙන් තවත් ඔප කළ හැකිය. එහෙත් එවාහි ඇති ස්වාභාවික වර්ගය නම්

වෙනස් වන්නේ නැත. වෙනස් කිරීමද කළ නොහැකිය. මෙය සත්‍යයි.

දෙවි තෙමේ එක් එක් ජීව වර්ගයාවටම විශේෂ ගුණාංග රැසක් පිරිනමා ඇත. මේ අනුව අපි ශුද්ධ වූ කුර්ආනය පරීක්ෂා කොට බලන්නේ නම්, එහි දෙවි තෙමේ මිනිසාට මූලික ගුණාංගයන් සතරක් පිරිනමා ඇති බව පෙනී යයි.

පළමුවෙන් අල්ලාහ් මිනිසාට තමාගේ මැවීම්වල නම් ඉගැන්විය. මෙම දැනුම, මිනිසා යම් දෙයක් දුටුකල එය හඳුනා ගැනීමටත් ඒ ගැන කල්පනා කිරීමටත් ඔහුට උදව් වන්නේය. එපමණක්ද? එම දේ නොදුටු විටද ඒ ගැන සිතීමටත්, කල්පනා කිරීමටත් උදව් වෙයි. මෙය වර්තමාන විද්වතුන් ගේ මතයයි.

මෙය තිරිසනුන්ගේ ස්වාභාවික පැත්තෙන් බලන විට හාත්පසින්ම වෙනස්ය. තිරිසනුන් අනෙක් දේ දුටුවහොත් පමණී එය හඳුනා ගන්නේ. එහෙත් යම් දෙයක් නැති තැනකදී වුවද එය වටහා ගැනීමේ දක්ෂතාවයද, ඒ ගැන කල්පනා කිරිමේ ශක්තියද අල්ලාහ් විසින් මිනිසාට පිරිනමා ඇත.

මිනිසා අනෙක් සැම මැවීමකටම වඩා උසස්වීමටත්. ශ්‍රේෂ්ඨ වීමටත් මිනිසාට හැකිවන්නේ මෙම වෙනසයි.

අල් කුර්ආනයේ සඳහන් වන දෙවැනි විශිෂ්ට ගුණය නම්, හොඳ නරක තෝරා බේරා ගැනීමේ විචාරවත් බුද්ධිය මිනිසා ලබා තිබීමය. මෙය හොඳ නරක තෝරා බේරා ගැනීමේ ඇතුලාන්ත හැඟීම යනුවෙන්ද කිව හැකිය.

අල්ලාහ් මෙසේ පවසයි:

"ආත්මය හා එහි පරිසමාප්ත කළ (අල්ලාහ්ගේ) නාමයෙන් ඔහු ඒ (මාත්මයට යහපත හා අයහපත පහළ කෙළේය. නියත වශයෙන්ම එය විශෝධනය කළ අය ජයග්‍රහකයෝය. එය (පාපයෙන්) යට කළවුන් පරාජිකයෝය." 91- 7 හා 8

මෙම මගපෙන්වීම සමග සම්බන්ධ වී තෙවැනි ගුණාංග සැකසී ඇත්තේය. එනම්, ආශාවන්ට හා පහත් හැඟීම්වලට වහල්වීමෙන් ගැළවීම. ස්වාධීනව ක්‍රියාකිරීමේ නිදහස, හොඳ නරක දෙකින් තමන් කැමැති එකක් තෝරා ගැනීමේ නිදහස, යනාදියයි. මෙම නිදහස නොහොත් උරුමය අල්ලාහ් මිනිසාට භාරයක් ලෙස දුන් බව සඳහන් කරයි. මෙම නිදහස භුක්ති විඳීමෙහි මිනිසා ඉතා වගකීමෙන් යුතුව ක්‍රියාකළ යුතුයි.

මේ ගැන අල්ලාහ් අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි.

*"නියත වශයෙන්ම අපි මහපොළොවටද, අහස්වලටද, තවද කඳුවලට භාරකාරත්ව (නියෝජන)ය ඉදිරිපත් කළෙමු. එහෙත් එවා එය ඉසිලීමට පසුබට වූහ. තවද, එයින් භීතියටද පත්වූහ. මිනිසා මේ ඉසිලූවේය. නියත වශයෙන්ම මිනිසා වරද්ද ගත්තේය. අඥානයෙක්ද විය." 33 – 72*

අල්ලාහ් මිනිසාට පිරිනමා ඇති සිව් වන ගුණාංගය අල්ලාහ් මිනිසාට පිරිනමා ඇති සිව් වන ගුණාංගය, මෙම තෙවැනි ගුණාංග සමග සම්බන්ධ වුවකි.

මෙය මිනිසා තුළට අල්ලාහ් ඇතුළු කළ ආත්මයයි. මිනිසාගේ ආත්මය අල්ලාහ් මිනිසාට පිරිනමා ඇති සිව් වන ගුණාංගය අල්ලාහ්ගේ ආත්ම යෙන් පිරිනමුණු ලැබුවකි. මෙයද අල්ලාහ් ශුද්ධ වූ අල් කුර්ආනයෙහි මෙසේ සඳහන් කරයි.

*“මා ඔහු (මිනිසා) ව හැඩගස්වා ඔහු වෙත මාගේ (ඔහුට උවමනා) ආත්මය කාවැද්දූ කල්හී......“ 15 - 29*

මිනිසාට පමණක් අල්ලාහ් හොඳ නරක තෝරා බේරා ගැනීමේ විචාරවත් බුද්ධියද, අධ්‍යාත්මිකව දියුණු වීමේ දක්ෂතාවයද පිරිනමා ඇත්තේය. එනම් ඔහුට පමණය අල්ලාහ් හඳුනා ගැනීමටත්, ඔහු වෙත ළංවිමටත් හැකිවනුයේ. ඒ මක්නිසාද යත් ඔහු වෙත ඇතුළුකොට ඇත්තේ අල්ලාහ්ගේ ආත්මයයි. නියත වශයෙන්ම මෙම උතුම් ගුණය හා අති ශ්‍රේෂ්ඨ තත්ත්වය, තිරිසනුන්ටද අනෙක් ජීවීන්ටද පිරිනමා නොමැත. මෙම ගුණාංග දෙකෙහි ඇති වැදගත්කම පහත සඳහන් (අල්ලාහ්ගේ වැකි රසූල් වරායගේ මුවින් පවසන) හදීස් අල් කුද්සි තුළින් වටහා ගත යැකිය.

1.“මම, සඟවා තිබුණු ලැබු වස්තුවක්ව සිටියෙමි. එබැවින් මාව අනෙක් අයට හඳුනා දීමට අදහස් කෙළෙමි. පසුව මාව හඳුනා ගැනීම පිණිස මෙම මැවීම (මිනිසා) මැව්වෙමි.“

2. “මාගේ පොළෙවෙහිද, මගේ අහස්හීද, මම අඩංගු වී නොමැත. එහෙත්, මගේ සැබෑ වූ වහලාගේ හදවත තුළ මම නිරතුරුවම රැඳී සිටිමි.“

ඉහත මම සඳහන් කළ කුර්ආන් වාක්‍යයද, නබි වදන්ද එකිනෙකක් විස්තර කරන විලාසයෙන් සැකසී ඇත. තවද මෙතුළින්, මිනිසා මෙම විශිෂ්ට ගුණාංග සහිතව මැවීමේ අරමුණද විස්තර කෙරේ.

මෙම ගුණාංක හා අපූර්ව ගති පැවතුම් කෙසේ ඇතිවූයේද යන්නට, පරිණාමවාදයෙහි කිසිදු විස්තරයක්, පැහැදිලි කිරීමක්

නොමැත. 'වානරයා ගෙන් මිනිසා පැවතෙන්නකි' යන මතය තුළින් මෙම විශේෂ ගුණාංග ගැන කිසිදු විස්තරයක් දීමට නොහැකිය. වානරයාගේ ගතිගුණවලටද, මෙතරම් ශ්‍රේෂ්ට මිනිස් ගතිගුණවලටද, කිසිදු සම්බන්ධ තාවයක් නොමැත. වානරයින් මෙම විශිෂ්ට ගුණාංග කිසිවිටෙක, කිසිදු විදියකින් ලබා නැති බව සාමාන්‍ය කෙනෙකු පවා දන්නා සත්‍යයකි. වානරයාගෙන් මිනිසා පැවත එන බව පවසන්නේ නම්, මෙම උතුම් ගුණාංග ඔහු වෙත තිබීම කිසිසේත් නොවිය හැකිය.

මෙම විශිෂ්ට ගුණාංග සියල්ල, අල්ලාහ් විසින් ආරම්භයේදීම මිනිසාට පිරිනමනු ලැබුවේය. මෙය බුද්ධිමත් කිසිවකුට පිටුපා යා නොහැකි සත්‍යයකි.

මිනිසාගේ බාහිර පෙනුම වෙනස් වන සුළුය. මිනිසා උස්වද, මිටිවද, මහත්වද, කෙට්ටුවද සිටිය හැකිය. එහෙත් ඔහුගේ මිනිසා නම්වූ ස්වභාවය කිසිවිටක වෙනස් නොවෙයි. ඔහු මවනු පැබු දින පටන් අද දක්වාම ඔහුගේ එම තත්ත්වය වෙනස් වීමකට ලක්වුයේ නැති බව ඉතිහාසය සාක්ෂි දරයි.

## 6. සාරාංශය

මෙතෙක් මම සාකච්ඡා කළ කරුණු අනුව ඔබ ඉදිරියෙහි අදහස් දෙකක් ඉතා පැහැදිලිව තබා ගන්නා බව විශ්වාස කරමි.

- මෙම විශ්වය බිහිවුයේ කෙසේද?

- ජීවින් බිහිවුයේ කෙසේද?
- මිනිසා බිහිවුයේ කෙසේද? යන කරුණු සම්බන්ධව

1. බටහිර දර්ශන ගෙනහැර දක්වන අනුමානයන්,

2. ඉස්ලාමය ගෙනහැර දක්වන බුද්ධියට එකගවු විවරණ, යනාදිය ඔබ වෙත විස්තර කොට ඇත්තෙමි.

පළමු (බටහිර විද්‍යාඥයන්ගේ අනුමාන) මතය "මිනිසා යම් අහඹු සිදුවීම තුළින් උපත ලැබුවෙකි. ඔහුගේ උපතෙහි කිසිදු අරමුණක් නැත. ඔහු ඉපදුනේ මැරෙන්නයි" යනු වාද කරයි.

අනෙක් මතය (ඉස්ලාම්) මිනිසා අල්ලාහ්ගේ ලස්සන, උසස්, උතුම් මාවීමක් නම් වූ සත්‍යය පැහැදිලිව පෙන්වා දෙයි. මිනිසා ඉතා වැදගත් අරමුණකින් යුතුව මවා ඇත්තේය. ඔහු ඕනෑම දෙයක් කිරීමේ දක්ෂතාවය ලැබුවකු බව එය තරයේ කියා සිටියි.

මෙම (ඉස්ලාම්) මතය, මිනිස් ජීවිතයේ නියම අරමුණ ගැන පැහැදිලිව දැනුවත්කොට මිනිසා යහමග යවයි. මැවුම්කරුවා හොඳහැටි වටහා ගෙන, ඔහුට අපි පෙන්විය යුතු කෘතඥතාවය, මෙනෙහි කොට දෙයි. මැවුම්කරු වූ අල්ලාහ්ට අපි පේන්විය යුතු යටහත් පහත් භාවයද ආදරයද දැනුවත් කරයි.

මිනිසා, තමා මැවීමේ අරමුණ වු අල්ලාහ් ගැන දැනුම ලබා ගැනීම, ඔහුට කෘතඥවීම, ඔහුට අවනත වී ඔහුගේ මාර්ගයේ ගමන් කිරීම - එනම් ඔහු පැවරූ කාර්ය නියම ලෙස වටහා ගනී.

මිනිසා කැමති වුයේ නම් මැවුම්කරුවා පිළිගෙන, ඔහු අණකර ඇති ආකාරයෙන් ඔහුගේ මාර්ගයෙහි ජීවත්වී, තමා මැවු

අරමුණ නිසි පරිදි සම්පූර්ණ කළ හැකිය. මෙනයින් ඔහු තමා වෙත ස්වභාවයෙන්ම ගැබ්වී පවත්නා, දේව හැඟීමට අනුකූලව ක්‍රියා කරන්නෙක් වනවා ඇත.

එසේ නොවේ නම්, තමා ඉබේටම ඇති වූ කෙනකු යන හැඟීමෙන් යුතුව, මැවුම්කරුවා සහ සත්‍යය යනාදිය ප්‍රතික්ෂේප කොට තමා මැවීමේ අරමුණ නිෂ්ප්‍රයෝජනය කළ හැකිය. මෙසේ කිරීමෙන්, ඔහු තමා තුළ ස්වභාවයෙන්ම ගැබ්වී තිබෙන, දේව හැඟීමට විරුද්ධව ක්‍රියා කරන්නකු වෙයි. මෙනයින් හෙතෙම අල්ලාහ් කෝපයට ලක් වනු ඇත.

මේ සම්බන්ධව අල්ලාහ් මෙසේ පවසයි.

*“ආත්මය, එය පරිසමාප්ත කළ (අල්ලාහ්ගේ) නාමයෙන් ඔහු එ(මාත්ම) යට යහපත හා අයහපත පහළ කළේය.*

*නියත වශයෙන්ම එය විශෝධනය කළ අය, ජය ග්‍රහකයෝය. එය (පාපයෙන්) යට කළවුන් පරාජිතයෝය.“ 91 – 7 සිට 10 දක්වා*

ශිෂ්‍ය ශිෂ්‍යාවනි, අනාගත විමුක්ති හටයිනි, විද්වතුනි, අනාගත පරපුරට නිසි අධ්‍යාපනයක් දීමේ වගකීම උසුලන්නනි, ඉහත මම විස්තරකොට ඇති ප්‍රතිපත්ති දෙකම, එනම් බටහිර විද්‍යාඥයින්ගේ ප්‍රතිපත්තිය සහ ඉස්ලාමය කෙරෙහි කරුණාකර ඔබගේ සිත යොමු කරන්න. ඒ දෙක සසඳා බලන්න. ඒවා ගැන තවතවත් ගැඹුරුව සිතා බලන්න.

ඔබගේ බුද්ධියට සහ ආත්මයට මෙම අදහස් දෙකින් කුමන අදහසද පිළිගත හැකිව තිබෙන්නේද යන්න ඔබම තීරණය කරන්න.

- මැවුම්කරුවා පිළිගන්නවාද? නැතහොත්

- ‘මැවුම්කරුවෙක් නැත. සෑම සියළු දෙයක්ම ඉබේටම ඇති වූ දේ වෙයි‘ යන මතය පිළගන්නවාද? යනු තීරණය කිරීම ඔබට බාරයි.

- මෙම අදහස් දෙකින් කුමක්ද සත්‍යය වන්නේ යනු අද වන තුරු ලාබී ඇති දැනුම හා අත්දැකීම් අනුව විමසා බලන්න. කුමන ප්‍රතිපත්තියක් අපට නොසන්සුන් තාවයක් ගෙන දෙන්නේද? කුමන ප්‍රතිපත්තියක් අපට සැනසුම හා තෘප්තිය ගෙන දේනේද? යනු සිතා බලන්න.

ජීවිතයට සැනසිල්ලද සිතට සතුට හා සාමයද ගෙන දෙනේනේ කුමක්ද එය පිළගන්න.

අවසාන වශයෙන් අපි පළමුව සහභාගි වූ සාකච්ඡා වටයට නැවත වරක් පිවිසෙමු.

මින්පසුවත් ඉනිමග වැනි පාවහන් - එනම් කිසිදු පහසුවක් නැති ගමන් කරන විට අවහිර ගෙන දෙන පාවහන්ද පැළඳ ගන්න යන්නේ?

එමෙන්ම ඉනට වද දෙන අශෝභන ඇඳුම් පැළඳුම්ද අඳින්න යන්නේ? නැත්නම් ගතට පහසුව ගෙන දෙන ගෞරවය හා සංවරභාවය ගෙන දෙන පාවහන් හා ඇඳුම්ද අඳින්න පළඳින්න යන්නේ?

- යහපත් දේ කුමක්ද?

- පහසු දේ කුමක්ද?

- සත්‍යය කුමක් ද?

යනු ඔබගේම බුද්ධිය භාවිතාකොට, ඔබගේම චේතනාව අනුව ඔබගේම අත්දැකීම් අනුව තීරණය කරන්න.

අනෙක් අයව අන්ධයන් මෙන් අනුකරණය නොකරන්න.

ළමයින් දෙදෙනෙක් විභාගයකදී ප්‍රශ්නවලට පිළිතුරු ලියමින් සිටියේලු. ඉන් එක් ළමයෙක් අනෙක් ළමයා ගේ පිළිතුරු අකුරෙන් අකුරට පිටපත් කොට ලියා දුන්නේය. මෙයින් සිදු වුයේ, අනෙක් ළමයාගේ සියළුම වැරදි පිළිතුරු අනුවණකමින් පිටපත් කොට ලිවීමේ හේතුවෙන් මෙම ළමයා විභාගයෙන් අසමර්ථ වීමයි.

මින් මතුවට හෝ අන්ධයින් මෙන්, අනුන් අනුගමනය කිරීමෙන් වැළකී සිටිය යුතුය. කුමක් හෝ අවබෝධයෙන් යුතුව කරන්නේ නම් වන්නේ යහපකති.

ශිෂ්‍ය ශිෂ්‍යාවනි, බටහිර චින්තන කිසිවක් දැස් පියාගෙන අනුගමනය නොකරන්න. කුමක්වුවද, ගැඹුරුව සිතා බලන්න. අතීතයේ මුස්ලිම් වරුන්, ග්‍රීක්වරුන්ගේ දර්ශනද, පොත්පතද ඉගෙන ගත්හ. එහෙත් ඔවුහු ඉස්ලාමය අතහැර දමා, අනු ප්‍රමාණයක් තරම් හෝ නොමග නොගියහ. ඒ වෙනුවට, ඔවුහු ග්‍රීක්වරුන් ජයගන්නා අන්දමින් බහුල වශයෙන් පර්යේෂණ පවත්වා බුද්ධිමත්ව ක්‍රියා කළහ.

මෙලෙස ඔබ සැමදෙන බටහිර චින්තයට ගොදුරු නොවී, එය වඩවඩාත් හදාරන්න. එය නිසි ලෙස වටහාගන්න. එයින් වන විපත් තේරුම් ගන්න.

කුර්ආනයේ නොයෙක් තැන්හි, අපට ලොව පවතින සියලු දේ ගැනම දැනුම් ලබාගන්නා ලෙසත්, ඒ ගැන කල්පනා කරන ලෙසත් අල්ලාහ් පවසයි.

*“ඔහු (අල්ලාහ්), අහස් හත තට්ටු සහිතව නිර්මාණය කළේය. මහා කරුණාන්විත (අල්ලාහ්ගේ) නිර්මාණයෙහි නුඹ කිසිදු ප්‍රතිෂේධයක් (පරස්පරවූ) නොදකින්නෙහිය. එසේම නැවතත් නුඹගේ දෘෂ්ටිය යොදවනු. නුඹ කිසිදු දෝෂයක් දකින්නෙහිද? නැවත නැවතත් දෘෂ්ටිය යොදවනු, නුඹගේ දෘෂ්ටිය තෙහෙට්ටු වී චකිතව නුඹ වෙතම පෙරළා පැමිණෙයි.“*
67 – 3 හා 4

අල්ලාහ්, තමා අනාවරණය කළ ශුද්ධ වූ කුර්ආනය ගැනත්, තමා මැවූ අනෙකුත් දේ ගැනත්, කල්පනා කරන මෙන් ඇරයුම් කරයි. එබැවින් එයට ප්‍රමුඛත්වය දී ඒ ගැන කල්පනා කිරීම අප සතු වගකීමකි. එවිට බටහිර චින්තනයට හා ජීවිත ක්‍රමයට ගොදුරුවීමෙන් වැළකී සිටින භාග්‍යය අපට ළගාවනවා ඇත.

ශිෂ්‍ය ශිෂ්‍යාවන් වූ ඔබ, සැම අධ්‍යාපනයක් හා පුහුණුවක් ලබමින් සිටින, හෙට උදාවන දවසේ උගතුන්ය. එහෙයින් මගේ මෙම ඇරයුම එබ පිළගත යුතුමයි.

කල්පනා කරන්න.

ක්‍රියාකාරී වන්න.

බටහිර චින්තනය ජයගන්න අල්ලාහ් ඔබ සැමට පිළිසරණ වනවා අතැ. ඔහු කාරුණිකයි. දයාන්විතයි. ඔහු පෙන්වා දුන් මාර්ගයෙහි ජය ලැබීම වනාහි දෙලොව යහපත ගෙන දෙනවාට කිසිදු සැකයක් නැත .

සර්ව බලධාරි අල්ලාහ් හැර අන් කිසිවකුගේ පිහිටක් ලෝවැස්සන්ට නොමැත.

ආමීන්.